## 2022/09/13 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2022/09/13 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 5. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 6. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 7. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 20. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 25. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 01. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 02. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2022.09.13 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

මෙම අවස්ථාවට සහභාගි වී සිටින සියලුම මන්ත්‍රී මණ්ඩලය ඉතාම ගෞරවපූර්වකව පිළිගනු ලබනවා. ඒ වගේම අද දින සභාවට නොපැමිණි ගරු සභිකයින් සභාවට නොපැමිණෙන බව මා හට දුරකතනයෙන් දැණුම් දුන්නා. නමුත් නොපැමිණෙන සභිකයින් ඔවුන්ගේ දීමනාව ලබා ගැනීමේදී වෛද්‍ය වාර්තා ඉදිරිපත් කොට එය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ අනුව නැවතත් අද දින සපැමිණි උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මම ඉතා ගෞරවයෙන් යුක්තව පිළිගනු ලබනවා.

**(අ)01. 2022.08.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

2022.08.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

ජාතික විගණන කාර්යාලයෙන් අප වෙත එවන ලද විගණන විමසුම් සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ගරු සභිකයන් දැනුවත් කරන ලදී.
01. 2021 වර්ෂය හා 2022 වර්ෂය සදහා නියමිත දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම සම්බන්ධව සභිකයින් දැනුවත් කිරීම
02. සභිකයින් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සම්බන්ධව උපරිම දායකත්වයක් ලබා නොදීම සම්බන්ධව දැනුවත් කිරීම

03. ඉන්ධන දීමනාව ලබාගැනීමේදී ඉන්ධන බිල්පත් ඉදිරිපත් කර එම දීමනාව ලබා ගැනීම සම්බන්ධව දැනුවත් කිරීම

04. ඉන්ධන දීමනාව ඉල්ලුම් කිරීමේදී ලබා දිය යුතු ලිපිලේඛන අඩුපාඩු වී ඇති බැවින්, අදාළ ලිපි ලේඛන ලබා නොදුන් සභිකයින් කඩිනමින් එම ලිපිලේඛන ලබා දෙන ලෙස දැනුවත් කිරීම

05. සභා වාරයට නොපැමිණෙන ගරු සභිකයන් වෛද්‍ය වාර්තා ලබා දීමෙන් පසු දීමනාව ලබා ගන්නා ලෙස දැනුවත් කිරීම

ගරු මන්ත්‍රිනී ඉනෝකා නෙරංජලී මහත්මිය, ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය, ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා පෙ.ව.9.55 ට සභා ගර්භය වෙත පැමිණෙන ලදී.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි සහ ලිපි ඉදිරිපත් කිරීම**

01. ශ්‍රියානි කිරින්දගේ මිය, පුස්තකාලයාධිපති, උඩුගම මහජන පුස්තකාලය විසින් 2022.09.12 දිනැතිව යොමු කරන ලද මහජන පුස්තකාල සදහා පරිත්‍යාග ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

01. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ගිය මස සභා වාරයේදී යොමු කරන ලද 2022 වර්ෂයේ පොහොර නිශ්පාදන හා අලෙවිය පිළිබඳ වාර්තාව සභාගත කරන ලදී.

**2022 වර්ෂයේ පොහොර නිශ්පාදනය හා අලෙවිය පිළිබඳ වාර්තාව**

| දිනය | නිශ්පාදිත ප්‍රමාණය | අලෙවි වූ ප්‍රමාණය | ඉතිරි තොගය |
|---|---|---|---|
| 2022.01.11 | 70 | | |
| 2022.01.13 | 75 | | |
| 2022.01.24 | | 10 | |
| 2022.01.29 | | 50 | |
| 2022.01.29 | | 50 | |
| | **145** | **110** | **35** |
| ජනවාරි ඉතිරි තොගය | 35 | | |
| 2022.02.09 | 25 | | |
| 2022.02.10 | | 10 | |
| 2022.02.10 | | 50 | |
| 2022.02.15 | 240 | | |
| 2022.02.17 | | 200 | |
| 2022.02.18 | | 40 (අඹ පැල සිටුවීම) | |
| | **300** | **300** | **0** |
| 2022.03.07 | 20 | 20 | |
| 2022.03.10 | 21 | 21 | |
| 2022.03.18 | 10 | 10 | |
| 2022.03.23 | 45 | 45 මිරිස් පැල සිටුවීම | |
| 2022.03.25 | 60 | 10 | |
| 2022.03.25 | | 50 පැල සඳහා | |
| 2022.03.30 | 100 | | |
| 2022.03.31 | | 100 | |
| | **256** | **256** | |
| 2022.04.18 | 25 | 25 | |
| | **25** | **25** | |
| 2022.05.05 | 30 | 30 | |
| 2022.05.23 | 150 | | |
| 2022.05.24 | | 100 | |
| 2022.05.24 | | 50 | |
| 2022.05.25 | 60 | | |
| | **240** | **180** | **60** |
| 2022.05.31 ඉතිරි තොගය | 60 | | |
| 2022.06.03 | 100 | 100 | |
| 2022.06.27 | 40 | 100 | |
| | **200** | **200** | |

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| 2022.07.07 | 50 | 50 | |
| 2022.07.14 | 12 | 12 | |
| 2022.07.14 | 30 | 30 | |
| 2022.07.26 | 50 | 50 | |
| 2022.07.26 | 10 | 10 | |
| | **152** | **152** | |
| 2022.08.09 | 65 | 65 | |
| 2022.08.10 | 20 | 20 | |
| 2022.08.29 | 25 | 25 | |
| | **110** | **110** | |

02.ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ගිය මස සභා වාරයේදී යොමු කරන ලද 2022 වර්ෂයේ අගෝස්තු මස උඩුගම සඳුදා සති පොළ සහ තල්ගස්වල බදාදා සති පොළ ආදායම් වාර්තාව සභාගත කරන ලදී.

| උඩුගම සඳුදා සති පොළ | | | | තල්ගස්වල බදාදා සති පොළ | | | |
|---|---|---|---|---|---|---|---|
| **2022 අගෝස්තු** | | **2022 සැප්තැම්බර්** | | **2022 අගෝස්තු** | | **2022 සැප්තැම්බර්** | |
| දිනය | ආදායම රු. | දිනය | ආදායම රු. | දිනය | ආදායම රු. | දිනය | ආදායම රු. |
| 08/01 | 7300.00 | 09/05 | 9000.00 | 08/03 | 8300.00 | 09/07 | 12400.00 |
| 08/08 | 8350.00 | 09/12 | 10050.00 | 08/10 | 8400.00 | | |
| 08/15 | 7200.00 | | | 08/17 | 10800.00 | | |
| 08/22 | 9550.00 | | | 08/24 | 14800.00 | | |
| 08/29 | 10050.00 | | | 08/31 | 6700.00 | | |
| එකතුව | **42450.00** | එකතුව | **19050.00** | එකතුව | **49000.00** | එකතුව | **12400.00** |

- 2022/08/31 තල්ගස්වල බදාදා සති පොළෙහි ආදායම අඩුවීමට හේතුව ලෙස ඉදිරිපත් කොට ඇත්තේ උදෑසන සිට අධික වර්ෂා සහිත දිනයක් බැවින්, එදින ආදායම අඩුවීමට හේතු වූ බවයි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා, පෙ.ව.10.10 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. ඉදිවන නාගොඩ ප්‍රාදේශීය සභා ආදාහනාගාරය වෙනුවෙන් ඇල්පිටිය වැවිලි සමාගමෙන් බෙදා වෙන් කර දුන් ඉඩම් කට්ටි කොටසේ මායිම් වැටක් ගැසීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා, ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතා, ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා, ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා, ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා, ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය, පෙ.ව.10.15 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

**02. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

2022.09.13 වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

**I.** 2022 අගෝස්තු මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත **රු.81,000.00**

II. උඩුගම ඇප්තොප්වත්ත ඉඩමෙහි කොම්පෝස්ට් පොහොර අංගනයේ ඇති පොහොර හලන යන්ත්‍රය සඳහා ඉබි යතුරු සවි කිරීමේ බිල්පත **-රු. 895.00**

III. ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය මුද්‍රිත ලේඛන ලබා ගැනීම සඳහා **-රු.9,562.25**

පොදු පෝරම - 8,315.00
15% වැට් බදු - 1,247.25
එකතුව - 9,562.25

**IV.** 2022.08.16 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සහභාගි වූ නිලධාරින් වෙත දීමනා ගෙවීම (රු.500.00 × 7) **- රු. 3,500.00**

V. සභාව සතු අත්‍යාවශ්‍ය සේවා වෙනුවෙන් යොදවනු ලබන වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් පියවීම. (ඩීසල් ලීටර් 100) **- රු.43,000.00**

VI. 2022.09.16 දින ආරම්භ වන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයෙන් නාගොඩ, මාපලගම හා උඩුගම මහජන පුස්තකාල සඳහා පොත් මිල දී ගැනීමට යන මුදල ලබා ගැනීම. ( අයවැයෙන් වෙන් කරන ලද) **-රු.150,000.00**

**02. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව** **- රු. 9,164.66**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් අගෝස්තු මස දීමනා ගෙවීම

**03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**

හිඟ විගණන ගාස්තු ගෙවීම **- රු. 10,000.00**

**04. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මුද්දර බදු අංශය,කොළඹ 02** **- රු. 5,025.00**

2021.07.01 සිට 2021.09.30 දක්වා ව්‍යාපාර බලපත්‍ර සඳහා මුද්දර බදු පියවීම -රු. 600.00
2021.07.01 සිට 2021.09.30 දක්වා වැටුප්වලින් අයකර ගත් මුද්දර බදු පියවීම-රු. 4,425.00

-

**05. රෙජිස්ටාර් ජනරාල්, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය, තංගල්ල** **- රු. 100.00**

නාගොඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් 2022 මාර්තු මාසයට අදාළව මුද්දර ගාස්තු උප ලේඛන සකස් කිරීමට අදාළ ගෙවීම

**06.** **රෙජිස්ටාර් ජනරාල්, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය, ඇල්ගිරිය.** **-රු. 1,200.00**

නාගොඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පිළියෙල කරන ලද මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීමට අදාළ ගෙවීම

2022 මාර්තු මාසය සඳහා - රු.700.00
2022 අප්‍රේල් මාසය සඳහා - රු. 400.00
2022 මැයි මාසය සඳහා - රු. 100.00

**07.** **සාමාන්‍යාධිකාරී , ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 355, කොළඹ 10** **- රු. 2,040.00**

නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම

**08.** **එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල** **- රු.6,000.00**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2022 සැප්තැම්බර් මස බදු කුලිය ගෙවීම

**09.** **පී.වී.අමල් බුද්ධික, තල්ගස්වල**

දුල්ෂාන් කාරියවසම් මැතිතුමාගේ පරිත්‍යාග මුදලින මිළදී ගත් පෙර පාසල් සඳහා පසල්ස් කට්ටල ඇසුරුම් කිරීම සඳහා ටියුලිප් බෑග් මිළදී ගැනීම (බෑග් 35) **- රු. 700.00**

**10.** **නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල**

I. 2022.08.26 දින L- 16242 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු -. **-රු. 3,500.00**
II. 2022.08.31 දින L- 13814 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු **-රු. 4,000.00**
III. 2022.09.01 දින SP – 138 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු **- රු. 5,000.00**

**11.** **පී.එල්. රංජන් මයා, ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, අංක 20 A, දෙවන පටුමග, ගාල්ල.**

විද්‍යුත් තැපෑල සඳහා නිල මුද්‍රාවක් සකස් කිරීම **-රු. 850.00**

**12.** **ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස්, ඇතුමලේ, ගාල්ල**

SPLL 7650 අංක දරණ කෘ කැබ් රථයේ වයින් හැඩලය දැමීමේ බිල්පත් පියවීම **-රු.1,100.00**

**13.** **කේ. එම්.ටී ඩිස්ට්‍රිබියුටර්ස්, ඉමදූව පාර, යක්කලමුල්ල, ගාල්ල**

**වීදි පහන් අලුත්වැඩියා කිරීම සඳහා Tumbler Switch 100ක් හා ටේපු රෝල් (XTP – 0001) 20ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම** **-රු.33,400.00**

Tumbler Switch 100 × 310 = 31,000.00
ටේපු රෝල් 20 × 120 = 2,400.00

**14.** **එම්.ජේ. ජනිත් ඉරේෂ්, කුමාර, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහළ ලේලවල, ගා/ වදුරඹ**

2022.08.09 දින පැවති මහ සභා වාරය සඳහා සංග්‍රහ වියදම් බිල්පත පියවීම **-රු. 11,704.00**

**15.** **ජී.එල්. ලක්මාලි, සාරංග ෆුඩ් සිටි, ඇතුමලේ, මාපලගම**

i. **ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සඳහා අවශ්‍ය ඉදල් ලබා ගැනීම** **- රු. 3000.00**
(12 × 250.00)

ii. සෞඛ්‍යය කම්කරුවන් සඳහා අවශ්‍යය ඩෙටෝල් වර්ගයේ සබන් කැට 216ක් මිල දී ගැනීමේ බිල්පත ගෙවීම. (216 × රු.108.00) **-රු.23,328.00**

**16. ඒ.කේ නිලන්ති සජීවනී, ග්‍රාෆ්ටෙල් කොමියුනිකේෂන්, යටලමත්ත.**

i. 2002 අගෝස්තු මස සහා වාර්තා පිටපත් 28ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු. 5,236.00**

ii. 2022 අගෝස්තු මස මන්ත්‍රීවරුන් සඳහා දුරකතන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත **-රු.28,500.00**

**17. ඒ.ඩී. කරුණාරත්න, සරත් ස්ටෝර්ස්, යටලමත්ත** **-රු. 8,760.00**

2022 අගෝස්තු මාසය සඳහා නාගොඩ මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම

**18. එම්.ඒ. සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම, ඇතුමලේ**

**2022 මැයි, ජුනි,ජූලි මාසවල දී මාපලගම මහජන පුස්තකාලයට පුවත්පත් මිල දී ගැනීම -රු. 11,030.00**

2022 මැයි මාසය සඳහා -රු.3,630.00
2022 ජුනි මාසය සඳහා -රු.3,400.00
2022 ජූලි මාසය සඳහා - රු. 4,000.00

**19. එච්. එල්. කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, සමගිගම, උඩුගම දකුණ, ගා/උඩුගම**

2022 **අගෝස්තු** මාසය තුළ දී උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු. 6,950.00**

**20. හොඳ හිත හාඩ්වෙයාර්, නව නගරය, තල්ගස්වල**

තල්ගස්වල සතිපොලේ කුණු ඉවත් කිරීම වෙනුවෙන් සවලක් මිල දී ගැනීම **- රු. 1,500.00**

**21. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල.**

තල්ගස්වල සතිපොලේ ජල ටැංකියේ සහ වතුර මෝටරය සහ නල පද්ධතිය අලුත්වැඩියා කිරීමට අවශ්‍යය උපකරණ මිල දී ගැනීම. **-රු. 2,680.00**

**22. නානයක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල**

**i.** කොතේගොඩ කන්ද මාර්ගය සංවර්ධනය කිරීමට අදාළව කොන්ක්‍රීට් කැඩීම සඳහා ඩයමන්ඩ් වීල් එකක් මිළදී ගැනීමේ බිල්පත **-රු. 1000.00**

ii. කොතේගොඩ කන්ද මාර්ගය සංවර්ධනය කිරීමට අදාළව දිනක බදුකුලීයට ලබාගත් ග්‍රයින්ඩරය සඳහා ගෙවීම **- රු. 700.00**

iii. ප්‍රධාන කාර්යාලයේ ජලනල පද්ධතිය අලුත්වැඩියා කිරීමට අදාළ බිල්පත් පියවීම **- රු. 1,055.00**

iv. ප්‍රධාන කාර්යාලයේ ජල ටැංකියේ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍යය උපාංග මිල දී ගැනීමේ බිල්පත පියවීම. **-රු. 1,670.00**

**23. දයානි පුද්. සමාගම, මාපලගම, ගාල්ල.**

i. මාපලගම ළමා උද්‍යානය අසළ කැටගල් ඇල්ලීම වෙනුවෙන් සිමෙන්ති කොට්ට 01 ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම **- රු. 3,200.00**

ii. ගබඩාවට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම ( ලොකු පුනීල-02, පෙට්‍රල් බට-01) **- රු. 2,200.00**

iii. උක්ඕවිට ප්‍රාදේශීය සභා පෙර පාසලට වතුර ලබා ගැනීමට අවශ්‍ය උපකරණ මිළදී ගැනීම **- රු.6,490.00**

**24. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී, වොක්ස්හෝල් වීදිය,කොළඹ 02**

Mp 2001L ඡායා පිටපත් යන්ත්‍රයේ වාර්ශික සේවා ගිවිසුමට අදාළ බිල්පත ගෙවීම **- රු. 16,800.00**

**25. අයි ඇන්ඩ් ආර් ට්‍රේඩිං කම්පැනි, නො.56/13, ශ්‍රී සංඝරාජ මාවත,කොළඹ 10**

කොන්ෆරන්ස් සිස්ටම් එකේ අක්‍රිය වී තිබූ Deligate unit 04 ක් සැපයීම සේවා කිරීමට අදාළ බිල්පත පියවීම **- රු.120,000.00**

**26.** **යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම - **- රු. 14500.00**

**27.** **ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ**

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම** **- රු. 376,300.00**

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.06.03 | PF 7360 කැබ්රථය | 370282 | ඩීසල් | 50 | 20,000.00 |
| 2022.06.09 | | 370289 | | 48 | 19,200.00 |
| 2022.06.17 | | 370292 | | 59 | 23,600.00 |
| 2022.06.21 | | 370295 | | 40 | 16,000.00 |
| 2022.06.26 | | 370296 | | 55 | 22,000.00 |
| 2022.06.30 | | 370297 | | 60 | 24,000.00 |
| | | | **එකතුව** | **312** | **124,800.00** |
| 2022.06.04 | 252-6478 කැබ් රථය | 370284 | ඩීසල් | 67 | 26,800.00 |
| 2022.06.09 | | 370287 | | 23 | 9,200.00 |
| | | | **එකතුව** | **90** | **36,000.00** |
| 2022.06.04 | LL 7650 කෘ කැබ් රථය | 370285 | ඩීසල් | 60 | 24,000.00 |
| 2022.06.13 | | 370290 | | 30 | 12,000.00 |
| 2022.06.20 | | 370294 | | 28 | 11,200.00 |
| 2022.06.30 | | 370298 | | 20 | 8,000.00 |
| | | | **එකතුව** | **138** | **55,200.00** |
| 2022.06.09 | LL 7366 ට්‍රක් ජල බවුසරය | 370288 | ඩීසල් | 100 | 40,000.00 |
| | | | **එකතුව** | **100** | **40,000.00** |
| 2022.06.06 | SPRA 8570 ට්‍රැක්ටරය | 370286 | ඩීසල් | 45 | 18,000.00 |
| 2022.06.18 | | 370293 | | 40 | 16,000.00 |
| 2022.06.30 | | 370299 | | 20 | 8,000.00 |
| | | | **එකතුව** | **105** | **42,000.00** |
| 2022.06.06 | SPRA 8570 ට්‍රැක්ටරය | 370286 | GL90 oil | 10 | 28,000.00 |
| | | | **එකතුව** | **10** | **28,000.00** |
| 2022.06.04 | LL 7103 ටිපර් රථය | 370283 | ඩීසල් | 80 | 32,000.00 |
| | | | **එකතුව** | **80** | **32,000.00** |
| 2022.06.15 | ගබඩා කර තබා ගැනීම සඳහා | 370291 | පෙට්‍රල් | 40 | 16,800.00 |
| | | | **එකතුව** | **40** | **16,800.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2022.06.15 | ගබඩා කර තබා ගැනීම සඳහා | 370291 | 2T oil | 01 | 1,500.00 |
| | | | **එකතුව** | **01** | **1,500.00** |
| **මුළු එකතුව** | | | | **876** | **376,300.00** |

**<u>සේවක ණය</u>**

**28. දස මස් වැටුප් අත්තිකාරම් මුදල් ලබා ගැනීම**

කේ.ජී. අනුෂා කුමාරි - සංවර්ධන නිලධාරි **-රු.250,000.00**

**29. <u>2022 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

I. මානෙල් සුදර්ශනී මිය - සංවර්ධන නිලධාරි **- රු. 6,200.00**
II. කේ.ඩී.එස්.නිපුනිකා මිය - සංවර්ධන නිලධාරි **- රු. 4,700.00**
III. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරික්ෂක **-රු. 4,000.00**

**30. <u>2022 සැප්තැම්බර් මස ගමන් වියදම්</u>**

**i.** ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරික්ෂක **-රු. 1360.00**

**31. <u>2022 අගෝස්තු මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

I. කේ.ඩී.එස්.නිපුනිකා මිය - සංවර්ධන නිලධාරි **- රු. 2,190.00**
II. කේ. එල්. එන්. ප්‍රමෝද් මයා - තාක්ෂණික නිලධාරි **-රු. 11,376.00**
III. අනුෂා සමරවික්‍රම මිය - තාක්ෂණික නිලධාරි **-රු. 12,888.00**
IV. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරික්ෂක **-රු. 1,420.00**
V. එම්. ඒ. වසන්ත මයා -රියදුරු **-රු. 700.00**
VI. අනුර දිසානායක -රියදුරු **-රු. 1,050.00**

**32. <u>අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2022 අගෝස්තු මස</u>**

එම්.ඒ.වසන්ත මයා - රියදුරු **- රු. 9,226.00**
අනුර දිසානායක මයා -රියදුරු **-රු. 3,306.00**
කේ.එච්.එම් කැලුම් චාමර මයා - රියදුරු **- රු. 856.00**
කේ. එච්.එම් නිශාන්ත ඉඳුනිල් - රියදුරු **- රු. 8,560.00**
ඩී.ටී.ආර්.ඒ. තරිදු ගුණරත්න මයා - මුරකරු **- රු. 5,537.00**
යසරත්න විජේසේකර මයා - මුරකරු **- රු. 7,700.00**
ඩබ්.කේ. සම්පත් සංජීව මයා - අනියම් රියදුරු **- රු. 8,560.00**
එන්.එම්.රජිත් මයා - අනියම් මුරකරු **- රු. 5,428.00**
ඒ.එච්.ජී. සංජීව - වැඩ/ක්ෂේත්‍ර කම්කරු **-රු. 2,734.00**
යූ.ජී.රංජිත් උදය කුමාර මයා - වැඩ/ක්ෂේත්‍ර කම්කරු **- රු. 1,299.00**
කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා - සෞඛ්‍ය කම්කරු **-රු. 3,080.00**
එම්.ඩබ්ලිව්.හර්ෂ කුමාර මයා - සෞඛ්‍ය කම්කරු **- රු. 5,483.00**

__රජයේ ආධාර__

__**2021 පළාත් නිශ්චිත**__

**33. එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය, කුරුපනාව**

**I. තල්ගස්වල වතුයායේ දෙවන පටුමග පිටුපස භූමියේ (පිට්ටනිය අසළ) වැසිකිළි පහසුකම් සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැදවුම් මුදල් ගෙවීම - රු. 18,290.11**

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 182,901.10
ගෙවා ඇති මුදල - රු. (164,610.99)
ගෙවිය යුතු 10% රැදවුම් මුදල -රු. 18,290.11

**II. තල්ගස්වල වතුයායේ 01 කොටසට පිවිසෙන මුත්තුමාරි අම්මාන් කෝවිල ඉදිකිරීම කර්මාන්තයේ රැදවුම් මුදල ගෙවීම -රු. 18,107.73**

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 181,077.30
ගෙවා ඇති මුදල - රු. (162,969.57)
ගෙවිය යුතු 10% රැදවුම් මුදල -රු. 18,107.73

**III. මාපලගම නගරයේ ළමා උද්‍යානයේ වැට ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ රැදවුම් මුදල් ගෙවීම -රු. 25,854.44**

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 258,544.40
ගෙවා ඇති මුදල - රු. (232,689.96)
ගෙවිය යුතු 10% රැදවුම් මුදල -රු. 25,854.44

**34. කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය, කැප්පිටියාගොඩ, නාගොඩ.**

**තල්ගස්වල දෙමළ කණිෂ්ඨ විද්‍යාලයට ප්‍රවේශවන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැදවුම් මුදල ගෙවීම - රු. 95,046.64**

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 950,466.43
ගෙවා ඇති මුදල - රු. (855,419.79)
ගෙවිය යුතු 10% රැදවුම් මුදල -රු. 95,046.64

**35. කළුඑළිය යාය ගොවි සංවිධානය, ගෝණදෙනිය**

**අපර්හෝමදොල කණිෂ්ඨ විද්‍යාලයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීම** කර්මාන්තයේ රැදවුම් මුදල් ගෙවීම **- රු.53,924.31**

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 539,243.15
ගෙවා ඇති මුදල - රු. (485,318.84)
ගෙවිය යුතු 10% රැදවුම් මුදල -රු. 53,924.31

**36. මාපලගම ග්‍රාම සංවර්ධන සමිතිය, ඇතුමලේ**

**තල්ගස්වල දෙමළ විද්‍යාලයේ පාසල් භූමිය වටා ආරක්ෂිත ආවරණයක් ඉදිකිරීම** වෙනුවෙන් වූ කර්මාන්තයේ රැදවුම් මුදල් නිදහස් කිරීම **-රු.24,938.50**

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 249,385.00
ගෙවා ඇති මුදල - රු. (224,446.50)
ගෙවිය යුතු 10% රැදවුම් මුදල -රු. 24,938.50

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් අංක 1 – 36 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී එන්.වී.සමන් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ) 2. රැස්වීම් රීති 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා.**

03.2006 වර්ෂයේ සිට පැවත එන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේශණය කල යුතු එකතු වටිනාකම රු. 3,057,262.00 ක වැට් බදු තැන්පතු හා මුද්දර බදු තැන්පතු 2006 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුන බැවින්, එහිදී අය කර ගත් බදු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට කාර්තුව අවසානයේ ප්‍රේශණය කල යුතු වුවද, අඛණ්ඩව ප්‍රේශණය නොකල හෙයින්, මෙම හිඟ ශේෂ නිර්මාණය වී ඇත. දිගින් දිගටම විගණන විමසුම් මගින් මේ සම්බන්ධව පෙන්වා දී ඇති අතර, ඒ නිසා 2017.05.21 දින පැවති අභ්‍යන්තර කමිටුව මගින් මසකට රු. 12000.00 බැගින් ගෙවීමට තීරණය කර ගෙවීම් සිදු කර ඇති අතර, එය අඛණ්ඩව සිදු වී නොමැත. 2016 සිට මේ දක්වා මුද්දර බදු ක්‍රමවත්ව ගෙවීම් සිදු කරමින් පවතී. ආදායම එකතු කල අගය මත බද්ධ අය කිරීමට තරම් ප්‍රමාණවත් තත්වයක් අප සභාව නොපවතින බැවින් එකතු කල අගය මත බද්දේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා 2013.01.09 දින නියෝජ්‍ය කොමසාරිස්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් මගින් දන්වා ඇත. මෙම හිඟ ශේෂය ගෙවීම සම්බන්ධව සුදුසු තීරණයක් ගන්නා ලෙස යෝජනා කරමින්, 2022.06.21 මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවට පැහැදිළි තීරණයක් නොලැබුනු හෙයින්, මෙම යෝජනාව නැවත ඉදිරිපත් කරමින් ගෙවීම් සම්බන්ධව සුදුසු තීරණයක් ලබා දෙන මෙන් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් දක්වමින්,**
නාගොඩ ප්‍රාදේශීය සභාව දිගින් දිගටම මේ දක්වා අඩු ආදායම්ලාභී සභාවක් ලෙස කටයුතු කරන බවත්, වරිපනම් අය නොකරන සභාවක් වන බැවින්ද, නිරන්තරයෙන්ම ගංවතුර ආපදා තත්වයන්ට ලක්වන හා නායයාම් අවධානම් සහිත බල ප්‍රදේශයක් වන බැවින්ද, කොරෝනා වසංගත තත්වයට දැඩි ලෙස ලක්වූ බල ප්‍රදේශයකින් යුක්ත වන බැවින්ද, 2006 සිට 2013 දක්වා හිඟ වැට් බදුද, 2006 සිට 2016 දක්වා මුද්දර බදු ගෙවීමට වර්තමානය වන විට සභාවට හැකියාවක් නොමැති බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට දන්වා යවන ලෙසත්, ඉදිරියේදී ආදායම් තත්වය යහපත් වූ විට හිඟ මුදල් ගෙවීම සම්බන්ධව සළකා බලන බවට යෝජනා කරමි.

**ඒ අනුව ඉහත සඳහන් ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. 2022 ඔක්තෝම්බර් ජාතික කියවීමේ මාසය මුල් කරගෙන නාගොඩ, මාපලගම, උඩුගම මහජන පුස්තකාල තුනෙහි පාඨකයින් සහ අනෙකුත් ප්‍රජාව සඳහා ඔක්තෝම්බර් මස 01 සිට 31 දක්වා කාලය තුල පුස්තකාල සාමාජිකත්වය නොමිලේ ලබාදීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. 2021 පළාත් නිශ්චිත සංවර්ධනසැළැස්ම යටතේ තල්ගස්වල මුත්තුඅම්මාන් මාරි කෝවිල අසළ මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රු. 129100.00 ක රඳවුම් මුදල ගෙවීම සඳහා අනුමත කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. උඩුගම ඇප්තොප්වත්ත ඉඩමෙහි ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි නොදිරණ කසළ බැහැර කිරීම සඳහා වලක් හැරීමේ අවශ්‍යතාවය පවතින බැවින් එම කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දෙන මෙන් සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා අදහස් දක්වමින්**
නොදිරණ කසළ සඳහා වලවල් කැපීම ඒක විශාල ගැටළුවක්. මොකද පසුව අපි ඒ බිමෙහි යම් කටයුත්තක් සිදු කිරීමට සිදු වුනහොත්, මේ නොදිරණ කසළ නිසා විශාල ප්‍රශ්නයකක් වෙනවා. එහෙමනම් අපි කරන්න ඕන තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය යටතේ එම ප්‍රදේශයේ යම් සුදුසු බිම් කොටසක් තෝරාගෙන එම කටයුතු සිදු කිරීමයි. එහෙම නැත්නම්, නොදිරණ කසළ ප්‍රතිචක්‍රීකරණය කරන්න වැඩපිළිවෙලක් හදාගන්න කියලා. ඉහත සදහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**
07. සභාව විසින් නිපදවන කොම්පෝස්ට් පොහොරවල දැනට පවතින මිළ, 4Kg පැකට් 01 ක මිළ රු. 60.00, තොග වශයෙන් 1Kg ක මිළ රු. 12.00 යි. මෙම මිළ ගණන් වැඩි කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදී.**
**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා අදහස් දක්වමින්,**
පොහොර 1Kg ක් සඳහා රු. 25.00 ක මුදලක් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ඒ අනුව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රීවරුන් විසින් කරන ලද යෝජනා**
**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**
08. මාපලගම ඒ ග්‍රාම නිලධාරී වසමේ මැටිවිලියගොඩ මාර්ගයේ අඩි 50 ක පමණ දුරක් පස් දමා ගොඩ කිරීම සඳහා ටිපර් රථ සඳහා ඉන්ධන ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රි වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**09. 214 බී කැටගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමේ කිඹුල්කොටුකන්ද මාර්ගය දැඩිව අබලන් වී ඇති හෙයින්, එම මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.**

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 03.ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. උඩුගම සතිපොළේ කඩ කාමර ප්‍රතිසංස්කරණය කිරීම අදියර III - රු. 635,000.00
02. ඌරල කොතේගොඩකන්ද මාර්ගයේ දයාරත්න මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සඳහා සිලින්ඩර් යෙදීම - රු. 60000.00
03. කොතේගොඩකන්ද මාර්ගයේ ඒ.කේ.කමලාවතී මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය හරහා සිලිංඩර් යොදා සංවර්ධනය කිරීම - රු. 160000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ඉ(04.) මිළ ගණන් ඉදිරිපත් කිරීම**

| **විස්තරය** | **උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම** | **නිව් යූනියන් මෝටර් වර්ක්ස්, ගාල්ල** | **අමින්ද මෝටර්ස්, උඩුගම** |
|---|---|---|---|
| මයිලෝමීටරය අලුතෙන් දමා වයර් පද්ධතිය පරික්ෂා කර මීටරය සෑදීම | රු.22500.00 | රු. 27250.00 | රු. 26,800.00 |

මයිලෝමීටරය අලුතෙන් දමා වයර් පද්ධතිය පරික්ෂා කර මීටරය සෑදීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම වෙතින් මයිලෝමීටරය අලුතෙන් දමා වයර් පද්ධතිය පරික්ෂා කර මීටරය සෑදීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කරනු ලදුව, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

01.2022.08.23 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ 1,3,4 යටතේ ඇති මිළ ගණන් සම්බන්ධ නිර්දේශ 2022.09.13 මහා සභාව මගින් ඒකමතිකව සභා සම්මත කරන ලදී

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

නැත.

ගරු සභාපතිතුමා හදිසි කටයුත්තක් වෙනුවෙන් පෙ.ව. 11.30 ට පමණ සභා ගර්භයෙන් පිටව යන ලද අතර ගරු උප සභාපතිතුමා විසින් සභාව මෙහෙයවන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

ගරු උපසභාපතිතුමා ඇතුළු සමස්ථ සභාවෙන් අවසරයි. ඇත්තයම මම ගිය සභා වාරයෙදීත් මතක්කලා දොරණවිල පාර සම්බන්ධව, ඒ සඳහා සභාපතිතුමා සිලින්ඩරකෑලි 02 ක් ගෙනැල්ල තියෙනව නමුත් තවමත් ඒ කර්තව්‍යය ඉයුවුනේ නැහැ. වැසි කාලයකට මනුස්සයෙකුට ඒ පාරේ යන්න බැහැ. පාසල් ළමයෙකුට සපත්තු දෙක දාගෙන යන්නවත් බැහැ. මම කියනවා ඒ කටයුත්ත ඉතා ඉක්මනින්ම සිද්ධ කරලා දෙන්න කියලා. ඒ වගේම ගරු සභාපතිතුමනි, ආදාහනාගාරය ගැන යමක් කියන්න තියෙනවා. එහි ඉදිකිරීම් කටයුතුවලදී එතන පොඩ්ඩක් ගිහිල්ලා, පරීක්ෂණයකට හරි ලක්කරන්න කියලා. මොකද මේ දවස්වල ඒකෙ සිදු වෙන වැරදි වැඩ සම්බන්ධව එකිනෙක මතිමතාන්තර යනවා. වැරදි වැඩ රැසක් සිදු වෙනවා කියලා අපට ආරංචි වෙනවා. ඒ වගේ මෙතන තියෙන බඩු බාහිර ආදිය පිළිබඳ සොයා බලන්න කියලත් මම කියනවා. මොකද ඒ පැත්ත ගොඩක් ජනාකීර්ණ නොවන පෙදෙසක් නිසා අපකීර්තියට ලක් වෙන දේවල් සිදුවෙනවා කියලා ආරංචියි. ගස්වලින් ආදාහනාගාරයට යන පාරත් වැහිල තියෙන්නෙ. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරමින්, එහි අධීක්ෂණ කටයුතු සිදු කරන්න කියලා ඉල්ලීමක් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

එම ආදාහනාගාරයට තිබෙන බිම් කට්ටි කොටසේ වැටක් ඉදි කරන්න දැන් යෝජනා වුනානේ. වටපිටාවේ පරිසරය හදාගන්න එක වැදගත්. ගස් හිටවලා පිරිසුදු කරලා, කට්ටිය ටිකක් දාගෙන ගිහිල්ලා, මොනයම් හෝ වගාවක් කරනවා නම්, ඒ සම්බන්ධව නිතරම බැලෙනවා. යැවෙනවා. එවිට මේ ප්‍රශ්න ටිකක් අවම කරගන්න පුලුවන් වේවි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ථ සභාවෙන් අවසරයි. පළමුවෙන්ම මලාමුරේ විහාරස්ථානයට ඉවතලන මල් හා දහම් පාසල් පැවැත්වෙන දිනවලදී ළමුන්ගේ ආහාර ගැනීමෙන් පසු ඉවතලන අපද්‍රව්‍ය දැමීම සඳහා විහාරස්ථානාධිපති විසින් ඩස්පින් 02 ක් ලබා දෙන ලෙස මාගෙන් ඉල්ලීමක් කරා. ඒ අනුව එම විහාරස්ථානයට ඩස්පින් 02 ක් ලබා දීමට අවශය කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අප මලාමුර කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් ඉන්නවා. රු. 75000.00 කට වැඩිය තේ ආදායම ලබා ගන්න මිනිස්සු. නමුත් එදා වේලවත් සොයා ගන්න බැරි ඉතාමත් අඩු ආදායම්ලාභීන් ඉන්නවා. සමෘද්ධිය නැති. එම විෂමතාවය නැති කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. එමෙන්ම, සමහර වෙලාවට මේ පොරොත්තු ලේඛනයේ ඉන්න අයට සමෘද්ධිය ලබාදීමේදී සමහර අවස්ථාවල අපි දැනුවත් නැහැ. එසේ තීරණ ගන්නා අවස්ථාවලදී පක්ෂ, විපක්ෂ සියළුම දෙනා කැඳවන්න ඕන. අපි ඒ සම්බන්ධව දැනුවත් නැහැ.

**ගරු උප සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

ඩස්පින් සම්බන්ධව, ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට ලේකම්තුමියට උපදෙස් ලබා දෙන අතර, සමෘද්ධි සහනාධාරය ලබාදීමේදී විෂමතාවයක් ඇති බව පෙනී යනවා. එය නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කල යුතුයි.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම කතාකරන්න යන්නේ සමෘද්ධි සහනාධාරය සම්බන්ධයෙන්. මම දකිනවා යම් නිවසක රජයේ නිලධාරියෙක් හරි ඉන්නවනම්, ඒ නිවසෙ සාමාජිකයෝ 10 ක් වුනත් ඉන්න පුළුවන්. එතනදි ඒ නිලධාරියා පිටින් දාලා, ඒ නිවසට මොනවත් නොලැබෙන තත්ත්වයක් තමයි තියෙන්නේ. අපි හරි මේවා සංශෝධනය කළ යුතු බව. ඉහලට හරි දැනුම් දීලා හරි ඒවට සාධාරණයක් වෙන්න ඕන කියන තැන මම ඉන්නවා.

ඒ වගේම තමයි සභාපතිතුමනි, අපි පහුගිය දවස්වලත් කතා කළා. කාන්තා ආරක්ෂන කමිටුවක් පිහිටුවන්න කියලා සිහිපත් කරනවා. මම හිතන්නේ ලෝක ප්‍රවණතාවය, ඒ වගේම වත්මන් ජනාධිපතිතුමත් කියනවා මේ කාන්තාව කියන කෙනාට දේශපාලනයේ මූලික තැනක් දෙන්න ඕන කියන කාරණය ගැන. අපට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වනිතා කටයුතු නිලධාරියෙක් ඉන්නවා. නමුත් අපි දන්නේ නැහැ. එතුමිය හරහා ගමට මොනවද වන සේවාවන් කියන එක සම්බන්ධව. ඒ නිසා අපි මන්ත්‍රී හත්දෙනෙක් මේ වෙලාවේ ඇවිල්ලා ඉන්නවා. මම හිතන්නේ අපි ගමේ ඉන්න කාන්තාවන් සම්බන්ධ කරගෙන, ඉදිරියේදී අපි ඉන්නේ නැති වෙයි නමුත් මේ කමිටුව හදල තිබුනොත්, අනාගතයේ දේශපාලනයට කාන්තාවන් විදිහට සම්බන්ධ වෙන්න ඉන්න අයට ක්‍රියාකාරීව මේක පවත්වාගෙන යන්න ඉදිරියේදී පුළුවන් වේවි කියලා. ඔබතුමාට මම යෝජනා කරනවා පුළුවන්නම් ඒ කමිටුව හදලා තියන්න කියලා. ඒ වගේම තමයි ඇප්තොප්පවත්තෙ පොල් සම්බන්ධව ආදායමක් තියෙනවද කියලා මම දන්නේ නැහැ.ඒ සම්බන්ධව දැනගන්න කැමතියි.

ඒ වගේම උඩුගම පාසලට උදේ 7.30 ට පෙර යන්න බස් රථයක් නැහැ. තරංග මන්ත්‍රීතුමාත් මේ කාරණාව ගැන දන්නවා. 369 මාර්ගයේ රෝහලට, පාසලට හා වෙනත් රාජකාරි වලට යන අය 7.30 විතර උඩුගමට ළගා වන බස් එකේ උඩුගම ඩිපෝවේ සිට පාසලට දුර කිලෝමීටර් එකක්වත් නැහැ. රට පුරාම බස්රථ තියෙද්දි, බද්දේගම හරහා උඩු ගමට යන බස් රථයක් නොමැතිවීම ගැටළුවක්. ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කරලා, ප්‍රවාහන ඇමතිතුමා බස්රථ අසූවක් යොදවනවා කියලා, ප්‍රකාශ කරලා තියෙනවා. ඉහලට දන්වලා එතුමාගෙන් හරි බස් රථයක් ඉල්ලලා, 369 මාර්ගයට යොදවන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු උප සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සහ ලේකම්තුමිය ප්‍රමුඛ සියලු දෙනාගෙන් අවසරයි.

ඒ වගේම සභාපතිතුමනි, මීට ඉහත සභා වාර දෙකේදී ඉල්ලීමක් කළා. අපේ සති පොළවල් වල ආදායම එකතු කරන ක්‍රමවේදය සහ දැනට එහි ආදායම් තත්වය කොහොමද කියලා දැනගන්න කැමතියි. පසුගිය සති පොළවල තිබුන යම් යම් ප්‍රශ්න එක්ක, තවමත් සභාවට ලාභදායී ආදායම් මුදලක් ලැබෙනවා ද? නැද්ද? ඒවා ප්‍රකාශයට පත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම ගයත්ති මන්ත්‍රීතුමිය කිව්ව වගේ, හෝමදොල පොල්වත්තේ පොල් ආදායම සභාවට ලැබෙනවද? මේ ආර්ථික අපහසුතා මැද අපටත් අමාරුයි. නමුත් තියෙන ආදායම් ටිකවත් ලැබෙනවද කියලා නිරීක්ෂණය කරන්න වෙනවා. මොකද සභාවට මේ වෙලාවේ හොඳ ආදායමක් ලැබෙන්න ඕන. ඒ නිසා ඒ පිළිබඳව මා සිහිපත් කරනවා. ඒ වගේම මාපලගම ගල්වාන මාර්ගයේ විදුලි පහන් ටික අලුත්වැඩියා කර දෙන්න කියලා මම ගරු සභාපතිතුමාගෙනුත් ඉල්ලීමක් කලා. තවම ඉටු වුණේ නැහැ. මම මේ වෙලාවෙ සිහිපත් කරනවා ගරු සභාපතිතුමා ට, පුළුවන් නම් මේ වීදි පහන් ටික අලුත්වැඩියා කරලා දෙන්න කියලා. මොකද මේ දවස්වල ප්‍රවාහන අපහසුතා තිබෙන අය ගොඩක් පයින් ගමන් කරන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම දීර්ඝව කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. පහුගිය කාලේ තිබ්බව අදූරදර්ශී පාලනයත් එක්ක, රට බොහෝ පහළ මට්ටමකට ගියා. යම් මට්ටමකට

වර්තමාන ජනාධිපතිවරයා රට ගෙනැල්ල තියෙනවා. පසුගිය දිනවල පැය 12- 14 විදුලිය කැපුවා. නමුත් වත්මන් ජනාධිපති ඒ තත්ත්වයෙන් රට මුදවා ගෙන තියෙනවා. යම්තාක් දුරකට භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීමේදී, අපහසුතාවයන්ට ලක් නොවන ලෙස යම් මට්ටමකට රට ගෙනැල්ලා තියෙනවා. මේ සියල්ල සමථයකට පත් කරන්න සහය දුන්නේ වත්මන් ජනාධිපතිතුමා. නමුත් මම කනගාටු වෙනවා. හිටපු පාලකයො නිසා මේ රටේ ජනතාව කොතරම් දුක් වින්දද? නමුත් මේ අයගේ අදහස නම් නැවතත් පෙර තත්වයට රට ගෙනියන්න.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

මූලාසනයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, සමස්ත සභාවෙන් අවසරයි. අපි ප්‍රථමයෙන් සමස්ත සභාව වෙනුවෙන් අද දින පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවෙ නායිකාවගේ අභාවය සම්බන්ධයෙන් සංවේගය පළ කර සිටිනවා. නමුත් මෙම සංවේගය පළකිරීම 1818 කැරැල්ලට කිසිදු අගතියක් නොවන බව මේ සභාවේ මතක් කරනවා.

ඊලගට සමන් මන්ත්‍රීතුමා මතු කරන කාරණයක් සම්බන්ධයෙන්, උඩුගම දකුණ යම් සිද්ධියක් සම්බන්ධව කතා කළා. විශේෂයෙන් ඒ උඩුගම ප්‍රදේශයේ ඔබ අප කතා කළ උන්මත්තක එම තරුණිය රාත්‍රිය වන තුරු මාර්ගයේ ගමන් කරනවා. නමුත් තියෙන ගැටළුව සභාපතිතුමනි, එම තරුණිය ළමයෙක් නෙවෙයි. තරුණියක්. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු වශයෙන් අපට තීරණයක් ගන්න එක පැත්තකින් අපොහොසත් වෙනවා. අනෙක් පැත්තෙන් පොලිසියට අපචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්න නොහැකි වෙලා තියෙනවා. විශේෂයෙන් ගාල්ලේ පොලීසිය එක්වරක් ඇයව අත්අඩංගුවට අරගෙන, නැවතත් උඩුගම පොලිසියට බාර දුන්නා. ඇවිදීම මිස අනාචාරය ඔප්පු කරගන්න බැරිවීම නිසා. ඒ නිසා උඩුගම පොලීසියටත් ඇය නිදහස් කර ගන්න සිද්ධ වුණා. ඊට අමතරව ඒ කාන්තාව මගේ ගමේමයි. ඒ නිසා අපි ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම්තුමා, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තා කාර්යංශයේ නිලධාරිනිය සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය ඇතුළු සියලු දෙනා එක්ව මේ පිළිබඳව සාකච්ඡා කළා. හැබැයි ගරු සභාපතිතුමනි, මම මුලින්ම කිව්ව වගේ සියලු දෙනාට යම් සැකයක් ඇති වුණා. මේ අවුරුදු 26 ක ළමයෙක් නිතර වීදිවල ගමන් කරන නිසාත්, ඇයට ඉන්නේ තාත්තා පමණක් නිසාත්, විවිධ අතවරයන්ට ලක් වෙන ඉඩකඩ තිබෙන නිසාත්, වෙන විසඳුමක් නැති නිසාත්, මුලින් සඳහන් කළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන්, මහමෝදර රෝහලේ නාරිවේද වෛද්‍යවරයෙක් හමුවෙලා ඇය තාවකාලිකව ගැබ් ගැනීම වලක්වන්න ක්‍රමවේදයක් සකස් කළා. ඒක දීර්ඝ කාලීනව කරන්න බැහැ. මොකද ඒකට කාටවත් අයිතියක් නැහැ. ආයෙම මම ග්‍රාම නිලධාරීතුමාට කතා කළාම කිව්වා ඒ කාලසීමාව ඉවරයි. නැවත ගැබ් ගන්න පුළුවන්. නමුත් නිරන්තරයෙන් ඇවිදිනවා. දිගින් දිගටම සමාජ මාධ්‍යජාලාවල යනවා. ඒ වෙනුවෙන් කුමන ක්‍රියාමාර්ග ගත්තත් ප්‍රශ්නයක් තියෙනවා. කොහොමහරි තමන්ගෙ තාත්තව සොයාගෙන යනවා. අනාචාරය ඔප්පු කරගන්නවත්, උසාවිගත කරන්නවත් බැරි වෙලා තියෙනවා. සියලු නිලධාරීන් එකතුවෙලා ඇය මානසික රෝහලට ගෙනිච්චත් ඒකත් නිශ්ඵල වුණා. බලන් ඉන්න කෙනෙකුට හිතෙන්නේ අහිංසක කාන්තාවක් ලෙස. කවුරුත් බලන්නේ නැහැ ඒ ගැන කියලා. නමුත් අනෙක් කාරණය තමයි සභාපතිතුමනි, කොතන නැවැත්තුවත් තාත්ත ගිහිල්ලා අරන් එනවා. නිලධාරීන්ට ප්‍රශ්නයක් තිබුණා. ඇයි තාත්තා ගිහිල්ලා අරන් එන්නෙ කියලා. ඒ සම්බන්ධව ගලෙන් පට්ටයක් ගත්තත්, මේ ළමයගෙන් වචනයක් ගන්න බැහැ. නමුත් වෛද්‍යවරු කියලා තියෙනවා. මේ ළමයට මේ අවශ්‍යතාවය දැඩිව තියෙනවා කියලා. ඒ වගේම සියලු නිලධාරීන් එකතුවෙලා සාකච්ඡා මට්ටමින් යනවා මේ සම්බන්ධව මොකද කරන්නේ කියලා. ගරු සභාව දැනුවත් කළේ ඒ සම්බන්ධයෙන්. නමුත් කිව යුතු කාරණාවක් නෙවෙයි. නමුත් සමාජ ප්‍රශ්නයක් නිසා ගමේ ප්‍රශ්නයක් නිසා මේ සම්බන්ධව කතා කළේ. රට ස්ථාවර තත්ත්වයකට පත් වෙනවා නම් මම කැමතියි. මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාලතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි.මම මුලින්ම කියන්න ඕන අපි මෙතැනට ඇවිල්ලා ඉන්නේ උපතේ සිට මරණය දක්වා යන්න තේමාව කරගෙන. මුලින්ම මට කියන්න තියෙන්නෙ. අනාගතයේ දරුවන් ගැන බලනකොට, ළමා උයනෙ ඇති ඔන්චිල්ලාවේ ඇණ ගැලවිලා, කුණු දාන්න ඩස්පින් එකක් නැහැ. සල්ලිත් දීලා සියලුම දේ කරල ඉවරයි. හැබැයි මේ නිලධාරීන් ගිහිල්ලා නිරීක්ෂණය කරලා තියෙනවා. නමුත් ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන නැහැ. අවශ්‍ය දේ කෙරිලා නැහැ. එය ඉතා ඉක්මනින් කරන්න කියලා ඉල්ලනවා. ඒ වගේම වනමල් මන්ත්‍රීතුමා කිව්ව වගේ, පොළ සම්බන්ධව කතා කරනවා නම්, පසුගිය මාසයේ හොඳ අධීක්ෂණයක් තිබුණා මේ නිලධාරීන්ගේ, ඒ මාසය පුරාම. සංජීව මුරකරුවෙක් ලෙස සේවය කළත්, ඔහු සම්බන්ධවත් අධීක්ෂණය කලා. හැම දෙයක් ගැනම සොයා බලනවා. මමත් ගියා පොළ අධීක්ෂණයට. මුළු මුදල් වශයෙන්, මම දන්න තරමින් ගිය සතියේ 14900.00 ක් එකතුවෙලා තියෙනවා. ඇත්තටම ධනුෂ්ක මහත්මයටත් ස්තුතිවන්ත වෙනවා. එතුමා පොලට ගිහිල්ලා, සෑහෙන්න මහන්සි වෙලා රාජකාරිය කළා. ඇත්තටම ඒ සම්බන්ධව ස්තුති කරන්න ඕන. ධනුෂ්ක මහත්තයයි, සංජීව මහත්තයයි සෑහෙන්න මහන්සි වෙනවා. අපි දන්නවා. සමහරු පොලේ මාළු ලෑලි ටික ඇතුලට ගන්න දුන්නෙ නැහැ. මම සභාපතිතුමාට කිව්වා. මාලු ලෑලි ටික අපෙන් අයින් කරගෙන ගිහිල්ලා පාලමෙන් එහා පැත්තට ගල්ලිද හරියට, අපට කරන්න බැහැ. නමුත් තිබෙන බලතල අනුව ඒගොල්ලොත් පොළ ඇතුලට ගන්න තත්ත්වයට පත් වුණා. ඒ වගේම තමයි කොම්පෝස්ට් ප්‍රශ්නය පිළිබඳව කතා කරනවා නම්, අපි නියමිත ක්‍රමයට, වැටමාර, සූරියකාන්ත වැනි කොළ වර්ග නොදා තමයි කොම්පෝස්ට් නිෂ්පාදනය කරන්නේ. පොළෙන් ගෙනියන එළවළු අපද්‍රව්‍ය වර්ග විතරයි, මැෂිමෙන් හලලා කොම්පෝස්ට් නිෂ්පාදනය කරන්නේ. මම ගිහිල්ලත් බැලුවා. එම කොම්පෝස්ට් හදන යන්ත්‍රයට ඉබි යතුරු දාන්න තමයි සාකච්ඡා වුණේ. ඇත්තටම ඒ කාරණය හොඳයි. දැන් පොහොර කිලෝ එකක් රු. 12.00 යි. එක වැඩි කරන්නත් කතා කළා. ඇත්තටම වෙන්න ඕන ඒ දේ තමයි. පොහොර කිලෝ එකක් රුපියල් 25.00 ක් කලාට පාඩුවක් නැහැ කියන එක තමයි මගේ අදහස. ඒ වගේම තමයි අපි කම්කරුවෙක් වැඩට ගන්නවා නම්, ඕනම ආයතනයක ඔහුට සලකන්න ඕන. ඔවුන් නිසා තමයි අපට පැවැත්මක් තියෙන්නේ. ඔහුට තුවාලයක් සිදුවුනහම ඒ බලධාරීන්ට කිව්වම ගණන් ගත්තේ නැති තත්ත්වයක් තියෙන්නේ. ඇත්තටම කණගාටුයි. මොකක්ද වුනේ ගලක් වැදුනද කොහේ වැදුනද කියලා බලන්න ඕන. නමුත් මෙතන ඉන්න නිලධාරීන්වත් ගණන් ගත්තේ නැති තත්වයක් තමයි වෙලා තියෙන්නෙ. නමුත් මෙතන ඉන්න සභාපතිවරයාට බැනලා තර්ජනය කරන්න බැහැ. මම ඒ ගැන කණගාටු වෙනවා. සභාපතිතුමා දැනුවත් නැතිව ඇති. ඔබතුමාට කේන්තියක් එන්න ඇති. නමුත් මේ කම්කරුවන්ගේ ප්‍රශ්න සම්බන්ධව ඔබතුමා සොයා බලන්න ඕනේ.

ඒවගේම කන්තෝරුවල රුපියල් 1900.00 වැඩිහිටි දීමනාව දුන්නා. ඒව දැන් ලැබෙන්නේ නැහැ. මම හොයල බැලුවා. මලාමුර පැත්තෙ 18 දෙනකුට ලැබිලා නැහැ. එම මුදල් නාගොඩ කන්තෝරුවෙ ලේකම්තුමිය ආපහු යවලා. කන්තෝරුවෙ වැරද්ද තමයි. ඇත්තටම ඒ පිළිබඳව සොයා බලන්න. ඒක අපේ වගකීමක්. ඇත්තටම අපට පාරවල් පිළිබඳ සොයා බලන්න ලොකු වගකීමක් තියෙනවා. මම දැක්කා ලොකු කුණු ගොඩක් දාලා තියෙනවා. ඒක මෙම ධනුෂ්ක මහත්මයා ඇවිල්ලා සුද්ධ කරවනවා දැක්කා. ඇත්තටම මෙතුමා යනවනම් වැඩ කරන තත්ත්වයක් උදාවෙලා තියෙනවා. ඇත්තටම අපි එතුමට ස්තුතිය පුදකරන්න ඕන.

ඒවගේම අපි දරුවෝ ගැන බලන්න ඕන. නමුත් දැන් දරුවෙකුට පාසලට යන්න පුලුවන්ද? රනිල් මහත්තයාගේ ආණ්ඩුවෙන් පොත්පත් අරගෙන පාසලකට යන්න පුලුවන්ද? පැන්සලයක් රුපියල් 40.00 යි. CR පොතක් රු. 450.00යි. සපත්තු දෙකක් රුපියල් පන්දාහයි. ඇත්තටම මේ ගොල්ලෝ ලැජ්ජ වෙන්න ඕන. රාජ්‍ය ඇමතිකම් 35 ක් දුන්නා. දැන් අපේ රට මන්දපෝෂණයෙන් පළමු තැනට වැටී ගෙන එන්නේ. දරුවෙකුට බිත්තරයක් දෙන්න විදිහක් නැහැ. මාළු කෑල්ලක් දෙන්න විදිහක් නැහැ. මොකක්ද මේ තත්ත්වය? ඇත්තටම ඒ ගැන සොයා බලන්න. මේ ජනපීඩක ආණ්ඩුව නම් පන්නන්නම ඕන. ජනතාවට කිසිම සහනයක් නැහැ. ඔබතුමාලට හිත රිදෙනවා ඇති මෙහෙම කියනවට. නමුත් මේක තමයි සත්‍ය කතාව.

ඒ වගේම තමයි බලන්න, මිනිස්සු මිනී මරන හැටි. මේ මහ දවල් වෙඩි තියලා යනවා. මෙන්න මේ හේතු නිසා පාතාල බිහිවෙනවා. ඒවගේම අපේ ගොවිතැන බලන්න. මම අක්කරයක් කළා.

ගිය සැරේ වී මළු 40 යි. මේ සැරේ වී මළු 20යි. පොහොර ටිකවත් දුන්න නම් එහෙම වෙන්නේ නැහැ. අන්තිම මොහොතේදී යූරියා පොඩ්ඩක් දෙනවා. ඔය ක්‍රමවේදය තමයි තියෙන්නේ. අලුතෙන් ආ අය මොනවද කරන්නේ? මම නම් හිතන්නේ ගරු සභාපතිතුමනි, මේ ගැන ගොඩක් හිතන්න ඕන. දරුවන්ගෙ මන්දපෝෂණය සම්බන්ධව සිතිය යුතුයි. රුපියල් 5000 ට මේ ෂොපින් කවරයකට බඩු ගන්න බැරි වෙලා තියෙනවා. අල කිලෝ එකක් 350.00යි. මාළු කෑල්ලක් 950.00යි. සැමන් එකක් 750.00යි. චිකන් කෑල්ලක් කන්න බැහැ. මිනිස්සු කොච්චර අසරණ වෙලාද ඉන්නේ. දළු කිලෝ එකක් ගැන අහන්න කලියෙන් පෝර මිටියක් කීයද කියල බලන්න. බලන්න තල්ගස්වල වත්තෙ ඉන්න මිනිස්සුන්ට රුපියල් 1000.00යි හම්බ වෙන්නේ. පාන් ගෙඩියක් කීයද? සීනි පන්සියයක් කීයද බලන්න. පාන්පිටි කීයද? ඒ මිනිස්සු වැඩියෙන් අනුභව කරන්නේ පිටි ජාති.
ඒ වගේම තමයි අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්වා. ලයිට් කපන්නෙ නැහැ කියලා. දැන් බලන්නකො ලබන අවුරුද්ද වෙනකොට පැය දොලහක් විතර ලයිට් කපනකොට කොහොමද කියලා. එ් වගේම තමයි නිදැල්ලේ ඉන්න හරක් ටික පන්නන ක්‍රමයකුත් හදලා දෙන්න. ඒ වගේම අපි සියලු දෙනාම එකතුවෙලා, මේ දරුවන්ගේ අධ්‍යාපනය හා සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවන්න ක්‍රමවේදයක් හදමු යැයි යෝජනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි, මට විශේෂ දැනුම් දීමක් කරන්න තියෙනවා. මේ සිද්ධිය සම්බන්ධව. උඩුගම සිටින සියලු මන්ත්‍රීවරුන් දැනුවත්. උඩුගම ප්‍රදේශය පුරාම අවුරුදු 18 ක විස්සක විතර මනස අවුල් වෙච්ච ගෑනු ළමයෙක් මුළු වීදිය පුරාම ඇවිදිනවා. මහ රෑ 12.00 ටත් වීදිවල ගමන් කරනවා. මම අද උදෙත් ඕඅයිසී මහත්තයා පවා දැනුවත් කළා. අද කාලේ අවුරුදු 90ක ආච්චි කෙනෙකුටවත් පාරේ බැහැලා යන්න බැරි සමාජයක, සභාව වෙනුවෙන් සාධාරණයක් ඉටු කරන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි කොහේවත්ම වීදි ලාම්පු වැඩ කරන්නේ නැහැ. එයත් අලුත් කර දෙන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**
ගරු සභාපතිතුමනි, මම කතා කරන්න බලාපොරොත්තු වුණේ පසුගිය නමවෙනි දා ඇති වූ සිද්ධිය සම්බන්ධයෙන්. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගෙත්, සුභාෂි මන්ත්‍රීතුමියගේ නිවෙස් වලට අලාභහානි කළා. ඒ සිද්ධ කළේ කවුද කියන කාරණය එතරම් වැදගත් නැහැ. තියෙන ප්‍රශ්නය තමයි ගරු සභාපතිතුමනි, එතුමන්ලාට සිදු වූ අලාභහානි සම්බන්ධව තක්සේරුව. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමාගේ ගෙදර තක්සේරු කරල තියෙන්නෙ රුපියල් 41000.00 යි. අපි ඒ සිද්ධිය වෙලාවේ බොහොම අමාරුවෙන් ගේ බලන්න ගියා. ඒ වෙලාවෙ ගෙදර තිබ්ච්ච මහා විශාල නයි යැවීමක් නෙවෙයි. අල්මාරියයි, කැබිනට් එකයි එහෙන් මෙහෙන් ගිහිල්ලා කුඩු කළා නෙවෙයි. පොඩි අයගේ ඇඳිවත පවා විසිකරලා දාලා. අපි යනකොටත් තිබුනා. ටීවී එක කුඩුපට්ටම් කරලා තිබුණා. ජනෙල් සේරම කුඩුපට්ටම් කරලා එළියට දාලා තිබුණා. ලීත් මෙච්චර ගණන්. මේ තක්සේරුව කවුද කළේ කියලා ඇහුවම කිව්වා. පොලිසිය ඇවිල්ලා නිරීක්ෂණය කරලා, මේක පොඩ්ඩක් හදාගන්න කියලා තිබුනා. ඉතුරු ටික ඉවත් කරලා අස් කරලා තිබුණා. අඩුම ගානේ ලක්ෂ දහයට වඩා අලාභ කරලා තියෙනවා. සුභාෂි මන්ත්‍රීතුමියගේ මල ගෙදරට ගියහම දකින්න ඇති. ලස්සනට තිබුන වැටවල් ටික විනාශ වෙලා තිබුණා. එතුමියටත් තක්සේරු මුදලක් අනුමත කර තිබුණා. ඒක තක්සේරු කලේ කවුද කියලා මම දන්නේ නැහැ. මට වඩා ඒක ලක්රුවන් මන්ත්‍රීතුමා දන්නවා ඇති. ඒක හරිම අසාධාරණයි. ඊට වඩා දේපල හානි වූ අයට තක්සේරු කරලා තියෙනවා. මේ මොනවත් කර කියාගන්න බැරිව ඉන්න මේ අසරණයන්ට රක්ෂණයක් නැහැ. මේ දෙන දීමනාවයි, පෝන් කාඩ් එකයි විතරයි නේ. මේ මිනිස්සුන්ටත් ජීවිතය යම්තම් ගොඩනගාගන්න උදව්වක් වශයෙන්. ගරු සභාපතිතුමනි, මේක වැරදියි මේක අදාල තැනට සාකච්ඡා කරලා, මේ තක්සේරුව මං දන්නේ නැහැ. රටේ අනිත් ඒව ගැන. මේ දෙක ගැන මම දන්න නිසා. වැඩියෙන් නෙවෙයි ඒ අදාළ කටයුත්තට විතරක්වත් මේ දේ කරල දෙන්න කියලා ගරු සභාවට මම යෝජනා කරනවා. අපේ යෝජනාව අදාල තැන් වලට යවලා කඩිනමින්

ඒ දේවල් කරලා නිම වුනොත්, නැවත ගෙවීම් කරන්නේ නැහැ මුදල ලබාදෙන්න කටයුතු කරන්න. එහෙම කෙනෙක් එක්සත් ජාතික පක්ෂයේ වේවා, ජනතා විමුක්ති පෙරමුණේ වේවා. කාටහරි එහෙම කෙනෙක් අපි දන්නැහැ කියාවි. නමුත් මේ ගෙවල් දෙක ට වෙච්ච අසාධාරණයට. පොඩි ළමයි තුන් දෙනෙක් ඉන්නවා. වැඩිවියට පැමිණි දරුවෙක් ඉන්නවා. ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු වෙන්න ඕන. ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන්න කියලා, මේ ගරු සභාවට මම යෝජනා කරනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒකට ක්ෂණික විසඳුමක් වශයෙන් සභාව වෙනුවෙන් අපි කිහිපදෙනෙක් යමුද හමුවෙන්න

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අජිත් එඩේරආරච්චි හිටපු සභාපතිතුමා ගෙනා යෝජනාව මම හිතන්නේ, අපි කවුරුත් පක්ෂ භේදයකින් තොරව සියලු දෙනා වෙනුවෙන්, මේ අවස්ථාවේ දී ස්ථිර කරනු ලබනවා. ඒ වගේම අපේ හිතවතා රංජිත් ජයවීර මැතිතුමාගේ කතාවේදී ඉතාමත් වැදගත් අදහස් ටිකක් මතුවුණා.අපි කවදත් වගේ වැදගත් දේවල් කතා කරන්නෙ මේ සභාවේ දී එතුමට උත්තර දෙනවට වඩා සමහර දේවල් මතක් කරන්න වෙනවා. මන්ත්‍රීතුමාට මතක නැතිව ඇති. නම කියලා කියනවට අකමැති ඇති. එතුමට මතක නැතුව ඇති. රට බාර ගන්න කොට තිබිච්ච තත්වය සහ එම කාලසීමාව කොහොමද කියලා. ඒ පිළිබඳව එතුමා හදපු තත්ත්වයක් ද  භුක්ති විදින්නේ? බඩු වල මිල අපි දන්නවා. පෑනෙ පැන්සලේ මිල අපි දන්නවා. පාසල් බස් රථයකට අපේ ප්‍රදේශයේ සිට යන්න මම හිතන්නේ රුපියල් දහදාහක් ගන්නවා. දහදාහක් කියන්නේ ළමයි තුන් දෙනෙක් ඉන්නව නම් තිස් දාහයි. සම්පූර්ණයෙන්ම ගෙදර ආදායම ඒක. ඉතින් ඒ වගේ තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒක ඔබතුමා මතක් කළා වගේම, මම හිතන්නේ මේ ජනාධිපතිවරයා හදපු ප්‍රශ්නයක් නෙවෙයි. එක ඔබතුමා තේරුම් ගන්න. ඔබතුමා බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාම හිතන්න ඕන.  එතුමා ජනාධිපතිවරයා ලෙස මේ රට බාර ගන්න කොට තිබිච්ච තත්වය පිළිබඳව. මොකද දැන් මෙම ප්‍රශ්න ක්‍රමානුකූලව විසඳගෙන යනවා.  අපි සතුටු වෙන්න ඕන. මොකද එදා වෙච්ච දේ කතා කරනවට වැඩිය භාරගත්ත දින සිට මේක හදාගෙන යනවා. ඉදිරියේදීත් ඒ තත්ත්වය හදා ගන්න දෙන්න පුළුවන් සහයෝගය අපි එතුමට දෙනවා. අපි කණ්ඩායමක් ලෙස බෙදිලා ඉන්නවට වඩා අපි රට වෙනුවෙන් ඉටුකරන්න ඕන යුතුකම් ඉටු කරමු අපි පෙර පරිදි මෙරට. එදා ඉඳලා කතා කරගෙන යනවට වඩා ගත්ත තැන ඉඳලා හදාගෙන යන එක තමයි තියෙන්නේ. ඉතින් ඒවා නිවැරදි කරන්න දෙන්න පුළුවන් සහයෝගය, අපි පක්ෂ භේදයකින් තොරව ලබා දෙනවා. මේ දවස්වල එතුමා වෙනුවෙන් මේ අවස්ථාවේදී පෙර පරිදි මේ රට ගොඩ නගාගන්න සහයෝගය ලබා දෙමු කියලා ඔබතුමාලටත් මතක් කරනවා. ඔබතුමාටත් සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මම අද කෙටියෙන් කථාව අවසන් කරන්නම්. උඩුගම ප්‍රාථමික පාසල අසල දැඩි අවදානම් තත්ත්වයක් තියෙනවා. එම ස්ථානය ගත්තම, නිරන්තරයෙන්ම කුඩා ළමයි ගමන් කරන පාරක්. ඉතාම වේගයෙන් වාහන ගමන් කරනවා. ට්‍රැක්ටර්, ත්‍රීවිල් වගේ වාහන, පාසලක් තියෙන ස්ථානයක් වශයෙන් නෙවෙයි ගමන් කරන්නේ. දකුණු පලාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරක්. අවශ්‍ය ආයතනයට දන්වලා අවශ්‍ය කටයුතු කරන්න. පොලීසියෙනුත් නිරන්තරයෙන්ම ඒ ප්‍රධාන පාරෙ ගැවසෙනවා. නමුත් යම් අවධානම් තත්ත්වයක් වෙන්න කලින්, එය වළක්වා ගත යුතුයි. අපි පුංචි දරුවන් ගැවසෙන හා ඉතාමත් තදබදයක් තියෙන ස්ථානයක් වන නිසා ඒ කටයුත්ත සම්බන්ධව අදාළ ආයතනය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා

ඒවගේම සභාපතිතුමනි ප්‍රධාන මාර්ගය හැදුවට පස්සේ කාණු පද්ධතිය හැදුවා. නමුත් අතුරු මාර්ග වල වතුර ප්‍රධාන මාර්ගයට එන්නේ නැහැ. වැස්සම අඩියක් දෙකක් වතුර. පොඩි ළමයින්ට බැහැල යන්නත් බැහැ.  කිසිම ක්‍රමවේදයක් නැහැ. ඒ කානු පද්ධතිය පිළිසකර කරන්න කියලා අදාළ ආයතනයන් දැනුවත් කරලා කටයුතු කරන්න කියලා මේ ගරු සභාවට යෝජනා කරනවා. ඒ වගේම මම හිතන්නේ උඩුගම මහජන පුස්තකාලයෙන් ඉල්ලීමක් කරල තිබුණා කිව්වා. මම අද ටිකක් ප්‍රමාද වෙලා පැමිණියේ. මම හිතන්නෙ පුස්තකාලවලට පරිත්‍යාගශීලීන් පොත් ලබා දෙන්න

බලාගෙන ඉන්නවා. පොත් ලබා දෙන්න, සහයෝගයක් දෙන්න කැමති කෙනෙක් ඉන්නවනම්, ඒ අවස්ථාව පුස්තකාල සමඟ කතා කරගෙන, ඒ නිලධාරීන්ටත් මේ සභාවෙන් ගන්න බලන් ඉන්නේ නැතිව, මම හිතන්නේ, ඒ පුස්තකාල වලටත් ලබාදීමේ හැකියාව ඇති. ඒ සඳහා අවශ්‍ය කරන අනුමැතිය අවශ්‍ය නම් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කලා. එක් කම්කරු මහත්තයෙකුට සිද්ධ වෙච්ච කාරණයක් සම්බන්ධව. එතුමා රැකියාවෙ නිරතවෙලා සිටි රාජකාරි වෙලාවේ. එතුමා සභාවට ආවට පස්සෙ, සභාවෙ ප්‍රධානියකු සහ සභාපතිවරයාට දැන්නුවත් ඒ සම්බන්ධව සොයා බැලීමක් කෙරෙන්නේ නැහැ කියලා, ඒ වගේ අවස්ථාවකදී ඔවුන් ගැන සොයා බැලීමක් කරනවා නම්, ආයතනය කෙරෙහි මීට වඩා විශ්වාසයක් ගොඩ නැගෙනවා. සභාපතිතුමාට වගේම ලේකම්තුමියටත් වගකීමක් තියෙනවා. ආයතනයේ වැඩ කරන නිලධාරියෙකුට එහෙම දෙයක් වෙනවා නම් සොයා බලන්න. මේ ගරු සභාවේ කතා කරන්න ඕන දේවල් නෙවෙයි. මම ගිය සභාවේදි කතා කළ උඩුගම දකුණු සහ මධ්‍යම මාර්ග නම් කිරීමේ බෝඩ් වල යම් වැරැද්දක් පෙන්නුවා. මම හිතන්නේ ඒවට මුදල් ගෙවීමට සභාවෙනුත් යෝජනාවක් ගෙනාවා. අපේ සහබන්දු මන්ත්‍රීතුමත් කතා කළා. ගිය සභා වාරයකදී එකම මාර්ගයේ බෝඩ් 2ක් ගහලා, සභාවේ ඇවිල්ල කතා කරලා, ඒ දේවල් සිදුවෙන්නේ නැත්නම්, අපි සභා වාරයකදී කතා කරන දේවල් ඊළඟ සභාවාරය වෙද්දී ඉෂ්ට වෙන්නේ නැත්නම්, අපි සභාවට විහිළුවට ලක් වෙන වැඩ කරන්නත් එපා. අපි අත උස්සන්නෙත් නැහැ. ඒ ගැන සොයා බලන්න කියලා ඉල්ලනවා. ඒක නිවැරදි කරලා අදාල කටයුත්ත සඳහා මුදල් ගෙවීම සිද්ධ කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම පසුගිය සභා වාර දෙක තුනකදී ඉල්ලීමක් කලා. ඉහළගම බස් රථය සම්බන්ධයෙන්. මම හිතන්නේ ඒකට පියවර අරගෙන තිබුණා. දැන් නම් වර්තමානයේ රුපියල් හයසීයක් හත්සීයක් විතර යනවා. ඒ කාරණාව සම්බන්ධව පසු විපරම් කරමින්, කාරණාව ඉටු වන තුරුම අදාළ කටයුතු කරන්න කියලා නැවතත් ඉල්ලා සිටිනවා.

සභාපතිතුමනි, උඩුගම මහජන ක්‍රීඩාංගණය අපේ සභාවේ මන්ත්‍රීවරු ක්‍රීඩා පිටියේ මැදින් වැටක් ගහල තියෙනවා. මම කියනවා නැවතත් ඒ ක්‍රීඩාපිටිය ප්‍රයෝජනයක් ගත හැකි ආකාරයට, පිට්ටනිය හා පොළ වෙන් කරල තියෙන්නෙ ඒ වැටෙන්. වැට රවුම් කරලා, අවශ්‍ය ටික විතරක් ගත්ත නම්, එම පිට්ටනියෙන් මීට වඩා ප්‍රයෝජනවත් දෙයක් කරන්න පුළුවන්. පොඩි වියදමක් ගියත් නැවතත් තිබුණු ආකාරයට ස්ථානගත කරන්න කියලා ඉල්ලීම් කරනවා.

ඒ වගේම උප සභාපතිතුමනි, උඩුගම කුරුපනාව දක්වා යන මාර්ගයේ සංවර්ධන කටයුතු අතරමග නතර වුණා. ඒ මාර්ගය ගොඩක් අඩුපාඩු පිට නතර වුණේ. විශේෂයෙන්ම උඩුගම බාර්හන්දියට යන විට තිබෙන පාලම් දෙක. මේ වන විට සංවර්ධන කටයුතු නැවත ආරම්භ කලත්, වදුරඹින් එහා තමයි ඒ කටයුතු කරගෙන යන්නේ. ඒත් මේ පාර නවත්වපු ආකාරයටමයි තියෙන්නෙ. සමහර දාට මෝටර්බයික් එකක්වත් ගන්න බැහැ. ඒ නිසා එම අවදානම් සහිත ස්ථාන වැටවල් තාප්ප කඩල දාපු ස්ථාන තියෙනවා. නැවත වැඩ ආරම්භ කරන්න විශාල සේවක පිරිසක් අවශ්‍යයි. ඒ වගේම එම කොන්ත්‍රාත්කරුවන් ඩීසල් නැහැ කියනවා. ඒ ප්‍රශ්නය අපට කියන්න බැහැ. විවිධාකාරයෙන් අපහසුතාවන්ට පත්වන ජනතාව වෙනුවෙන්, අදාල ආයතන දැනුවත් කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම සභාපතිතුමනි, ඒ ඒ කටයුතු වල දී මෙතන ඉන්න නිලධාරි මහත්මයෙක් ගැන කතා වුණා. එතුමා ගැන නිලධාරියෙක් ලෙස සොයා බලා කටයුතු කිරීම සම්බන්ධව අපි සතුටු වෙනවා. මට මතකයි එතුමා උඩුගම රෝහලේ ඉන්න කාලේ අපිත් එක්ක ගොඩක් සම්බන්ධ වෙලා කටයුතු කරපු නිලධාරි මහත්මයෙක්. අද වන විට උඩුගම රෝහලෙත් අඩුපාඩු කිහිපයක් තියෙන, ගොඩක් රෝගීන් එන රෝහලක් ලෙස උඩුගම රෝහලට එක්ස්කිරණ නිලධාරීන් තුන්දෙනෙක් විතර අවශ්‍යයි. අවම වශයෙන් එම නිලධාරීන් ලබා ගන්න අවශ්‍ය තැන් දැනුවත් කරන්න කියලා ලිඛිතව ඉල්ලීම් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම භෞතික

චිකිත්සක වරයෙක් නැහැ. ඒ වගේ ලෙඩෙක් ගෙනියන්න ඕන ගාල්ලට. තෙල් මිල නිසා, ඒ සඳහා වර්තමානයේ උඩුගම සිට රුපියල් හය දාහක් හත්දාහක් යනවා. එම තනතුරු දෙක සඳහා උඩුගම රෝහලට අදාල නිලධාරීන් කැඳවන්න කියලා අදාල ස්ථානවලට ලිඛිතව දන්වන්න කියලා ඉල්ලා සිටිමින්, අවසාන වශයෙන් අපේ සහබන්දු මන්ත්‍රීවරයා ඉල්ලීමක් තිබුණා. ඌරල සතොස, උඩුගම සතොස පිළිබඳව ඉල්ලීමක් කරා. සභාපතිතුමාගෙනුත් ඉල්ලීමක් කලා. උඩුගම සතොසේ විශාල වශයෙන් පාරිභෝගිකයෝ පාවිච්චි කරන තැනක්. කුණු ටික පුච්චන්න බැහැ. පෙර ආකාරයට සභාවෙන් සහයෝගය ලබා දීලා, රජයේ ආයතනයක් විදිහට විශාල සේවාවක් සපයන ආයතනයක් ලෙස, ඉවත ලන ද්‍රව්‍ය අයින් කරන්න සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලමින්, උප සභාපතිතුමාගේ මැදිහත්වීමෙන් සියලු කාරණා කෙරෙහි අවධානය යොමු කරන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, සමස්ත සභාවෙන් අවසරයි. මා සම්බන්ධ කරුණක් මේ සභාවේ කතා වූ බැවින්, යම් අදහසක් ඒ සම්බන්ධව ඉදිරිපත් කිරීමට අවශ්‍යයි. අපේ සමන් මන්ත්‍රීතුමා මතුකරපු කාරණය සහ හිටපු සභාපති අජිත් එඩේරආරච්චි මහතා ඒ පිළිබඳ කරුණු දැක්වූවා. මම හිතන්නේ එතුමා කියපු කතාව ප්‍රමාණවත්. මම තවදුරටත් එම කරුණ ගැන නිතර නිතර කියන්න සූදානම් නැහැ. එම කාරණා යෙදී තියෙන්නෙ අපි යම් යම් කරුණු ඉදිරිපත් කිරීමේදී බලපාලා තියෙන ප්‍රායෝගික ගැටලුවක්. පැහැදිලිව ඒ කාන්තාව මගේ විද්‍යාලයටත් විටින් විට පැමිණෙනවා. අපි දන්න කියන හිතවත් පවුලක. විද්‍යාලයට ආසන්නයේම කෙනෙක්. එතනදි ප්‍රශ්නෙ තියෙන්නෙ, ප්‍රායෝගික ගැටලුවක් කියන්නේ, එතුමියට යම් මානසික ගැටලුවක් තියෙන බව බලන ඕන කෙනෙකුට පේනවා. මේක ඔප්පු කරගන්න ක්‍රමයක් වෛද්‍ය විද්‍යාවේ නැතිවීම ප්‍රායෝගික ගැටලුවක්. අපි බැලුවා සමහර අපේ මැති ඇමතිවරු, ඉහළ පෙළේ අය රෝහල් ගතවෙන්න ඕන වුනහම, ඕන තරම් වාර්තා දෙන සමාජයක්. ඉතින් එහෙම වෙලාවක මේක ප්‍රායෝගික ගැටළුවක් වෙන්නේ නීතිය පැත්තෙන් කටයුතු කරන්න ගියහමත් ඒ විදියටම බලපාල තියෙනවා. අද කතා කරන විදිහටත් අනවශ්‍ය ඕන තරම් අය අත්අඩංගුවට ගන්නවා. අවශ්‍ය කෙනා අත්අඩංගුවට ගන්න බැරි ප්‍රායෝගික ගැටලු තමයි මේවා. ප්‍රායෝගික ගැටළු විසඳීමේ ක්‍රමයක් එනතාක් මේවා දිගින් දිගටම පවතිනවා. ඒ වගේම අපේ ජයවීර මන්ත්‍රිතුමා ආපු දවසේ ඉඳලම හරක් ටික් එලවන්න ට්‍රයි කරනවා. අපේ කොට්ඨාශයෙත් මේ ගැටලුව තියෙනවා. තාම මොනවත් වෙලා නැහැ. මම හිතනවා මේ ප්‍රායෝගික ගැටලු තියෙන තාක් කල් ඉදිරියටත් අපි කතා කරමින් තියේවි. නමුත් ඒවා නිවැරදි වෙන ක්‍රමයක් සකස් කළ යුතුයි.

ඊළඟට අනෙක් කාරණය අපේ තරංග මන්ත්‍රීතුමා මතුකළ ගැටලුවක්. උඩුගම නැගෙනහිර බංගම පාරේ, බංගම මංසන්දිය දක්වා ගමන් කරපු බස් රථය, මේක ඉතිහාසයක් තියෙන බස් රථයක්. ෆවුසි ඇමතිතුමා ආරම්භ කළ බස් රථයක්. මේක හිමිහිට නතර වෙනවා. කාලයක් මේ ප්‍රදේශයේ ජනතාව භාවිතා කල, කරාපිටිය රෝහලට නියමිත වෙලාවට යන බස්රථයක්. හිටපු ගමන් දවසක් එනවා. ආයේ දවස් දෙකක් නැහැ. දවස් තුන හතරක් එනවා. ආපහු දවසක් නැහැ. ඉතින් මෙහෙම වැඩ කරලා, මෙහෙම ගමන් කරලා මිනිස්සුන්ගෙ විශ්වාසය දිනාගන්න බැහැ. සමහර වෙලාවට ඒ අයගෙන් ඇහුවම, දෙන උත්තරය තමයි. ඒක පාඩුයි කියලා. ඒක පාඩුලබන බස් රථයක් නෙවෙයි. බස් රථ අතර ලාභ ලබන බස්රථයක්. විශේෂයෙන් මේ වෙලාවේ මතක් කරනවා එවැනි කරුණු වලට ඉඩ නොදී, ජනතා සේවයක් හැටියට ඉල්ලීමක් කළා. අපේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ ඒ වෙලාවෙ ආපු නිලධාරියෙක් පිළිතුරු දුන්නේ එතුමා එම බස් රථය නතර කිරීමට හේතුව ලෙස දැක්වූයේ, මාර්ගය දෙපස තණකොළ වැව්ච්ච නිසා යන්න බැහැ කියපු කාරණය දුන්නෙ. ඒ වගේ විහිළු කතා කියමින් ඒ බස් රථය යෙදුවා. අගමැති ධූරයට පත් වෙච්ච ගමන් දැම්ම බස් රථය ආපහු සතියයි දිව්වෙ. මේ බස් රථය යොදවන්න කිච්චට මදි. ප්‍රධාන දේ වෙන්න ඕන ජනතාවගේ හිත දිනාගන්න එක. සේවයක් හැටියට කතා කළොත් නියමිත කාලසටහන අනුව ක්‍රියාත්මක කරලත්

ලාභ ලබන තත්ත්වයට පත් වෙයි. ඒ නිසා ඒ අදාළ ආයතන දැනුවත් කිරීමේ දී මම හිතනවා මේ පිළිබඳව මනා පැහැදිලි කිරීමක් කරලා මේ බස්රථ යොදවන්න කියලා ඒ පිළිබඳව බලධාරීන් දැනුවත් කරන්න කියල ඉල්ලා සිටිනවා. ඒ වගේම මාර්ග නම් කිරීමේදී එකම ස්ථානයේ බෝඩ් 02 ක් ගැසීම සම්බන්ධ ගැටලුව, එකම නමින් එම මාර්ග දෙකක් තිබීම නිසා එය නම් කිරීමේ දී ගැටලුවක් පැන නැගුණු නිසා, අපට මෙසේ කරන්න සිද්ධ වුණා. සභාපතිතුමනි, එමනිසා එක බෝඩ් එකක් ඉවත් කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා. මොකද මගේ ගම් ප්‍රදේශයේ පැනනැගුනු ගැටළු කිහිපයක් නිසා මම මේ සම්බන්ධව කතා කළේ. බොහොම ස්තූතියි.

**ප.ව. 1.30 ට පමණ ගරු සභාපතිතුමා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම මුලින්ම පසුගිය වාර්තාව සම්බන්ධව අදහස් ප්‍රකාශ කරනවා නම්, දැන් ඒක ස්ථිර වෙලා තියෙන්නෙ. මම ටිකක් ප්‍රමාද වෙලා පැමිණුනේ. ගිය සැරේ වාර්තාවෙන් අපි ඉල්ලලා තියෙනවා කොම්පෝස්ට් පොහොර ආදායම සම්බන්ධව. පොහොර පිළිබඳ නිෂ්පාදන වියදම. ඊළඟට දැනට තියෙන ස්ටොක් එක. ඒ සභාවට ඉදිරිපත් කිරීමේ හැකියාව තියෙනවාද කියලා මම දන්නෙ නැහැ.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඒක ඔබතුමාගේ වරද, මොකද ඔබතුමා වෙලාවට නොපැමිණීම. මම ඒ සියල්ල සභාවට ඉදිරිපත් කළා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

හරි, පොල් ආදායම ඉදිරිපත් කළාද?

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මන්ත්‍රීතුමනි ඇත්ත්‍රොප් වත්තේ අපට ලබා දී තිබෙන කොටසේ ඇති පොල් ගස්වල අයිතිය අපට නැත. එය ප්‍රාදේශීය ලේකම් සතුයි. ඒ නිසා පොල් ඵලදාව අපට ලබාගත නොහැකියි.නමුත් පසුගිය අවුරුද්දක ආදායම අප ලබාගත්තේ ටෙන්ඩර් මගින් එම ගස් අප සභාව ගත් නිසාය.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

පොල් නැත්නම් වැඩක් නැහැ. ඒ මාතෘකාව ඉවරයි. මීට පස්සේ මුරකාරයෙක් වැඩක් නැහැ. මොකද මුරකාරයෙක් දාන්නෙ ගස් පරිස්සම් කරන්නනේ.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මර කරුවන් දමා ඇත්තේ කොම්පෝස්ට් අංගනය ආරක්ෂා කිරීමටත් සමඟ අපට ඕන නම් පොල් කඩා ගන්න පුළුවන්. තවම අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තියෙන්නේ

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

වෙනදා පොල් ආදායමක් ආවා. මෙතන ලේකම්තුමිය ඔබතුමිය දන්නව ඇති. පොල් වලින් යම්කිසි ආදායමක් තිබුණා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මම සභාපති වූ වහාම මෙම පොල් ගස්වල පොල් ඵලදාව ලබා ගැනීමට වෙන්දේසියට ඉදිරිපත්වී එය ලබාගත්ත නමුත් අපි බලාපොරොත්තු වූ ආදායමක් ලැබුනෙ නැහැ.පසුව පොල් මිල සීඝ්‍ර යෙන් බැස්ස නිසා එය පසු වෙන්දේසි වලදී කිසි කෙනෙකු එය ලබා ගැනීමට ඉදිරිපත්වුනේ නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

හරි. ඉඩමත් අපේ නෙවෙයි. පොල් ආදායමක් නැහැ. ඒ ගැන කතා කරලා වැඩක් නැහැ නේ මීට පස්සෙ. ඒ ගැන කතා කරන්නේ නැහැ. අපේ දර ආදායම පිළිබඳව විස්තර සභාවට ඉදිරිපත් කළේ නැද්ද? දර යාර කීයක් කැපුවද? කීයක් විකුණුව ද? ඒවායේ ආදායම කොපමනද? ඊළඟ සභාවට ඉදිරිපත් කරන්න. නිලධාරියකුගේ අඩුපාඩු පෙන්නුවා. එම නිලධාරීන් තවම සභාවේ ඉන්නවද? එම නිලධාරියාට විරුද්ධව ගත් පියවර මොනවද? ආදායම අඩුය කිව්වා. පොලේ ගහගත්තා කිව්වා. රු:8000ක් හෝ රු: 10000ක් පොලෙන් සභාවට ගෙනා ආදායම මාසය අවසානයේ රු: 48000 ක්, රු: 50000 ක් ආව කියන්නේ වංචාවක් සිද්ධ වෙලා නේ. එතකොට ඒ කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන්නේ ඊළඟ සතියෙම වැඩිවෙනවා කියන්නේ මෙතන වංචාවක් රු: 400ක් රු:500ක් කඩන්නෙ. රු :200 කොලේ තියෙන්නෙ

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඔබතුමා එන්න කලින් මේ ආදායම් ඉදිරිපත් කළා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ඉදිරිපත් කළාට කවුරුවත් මේක හරියට කතා කළේ නැහැ. ආදායම ආවා. ඒ මුදල් කොහෙට හරි ගිහිල්ලා තියෙනවා. වංචාවක් සිද්ධ වෙලා තියෙනවා. එතකොට අපි මෙතැන කමිටුවක් පත් කළා. කමිටුවේ වාර්තාව, මේ නිලධාරියා මෙතන හොඳින් ඉන්න එක නෙවෙයි. එම නිලධාරියා කරපු වැරැද්දට ගනිපු තීන්දුව මොකක්ද කියන එක තමයි. පෙර වැරදි වලට මොකද වුනේ. පැහැදිලිව උත්තරේ තියෙනවා. බිව්වා, ගහගත්තා කියලා. රුපියල් 200ක් කඩලා නෑ ඕකෙ මම වෙළෙන්දො ගාවට ගිහිල්ලා කතා කළා. තමුන්නාන්සේට දුරකථනයෙන් කතා කළා. මම එතන ඉදන් මාළු වලින් රුපියල් 500.00, 800.00 ක් කඩල තියෙනවා.

**ගරු සභාපතිතුමා**

මන්ත්‍රීතුමා, වැරදි වෙලා තියෙනවා. ඒවා ඔප්පු කර ගැනීමේ හැකියාව නැහැ. පොල් වගේ තමයි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

නිලධාරී ගිහිල්ලා අධීක්ෂණය කරලා, එක සතියක ආදායම කියන්න. ඔබතුමා ගිහිල්ලා එක සතියක් ආදායම කීයද කියලා කියන්න.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

අඩුපාඩු වෙලා තියෙනවා. ඔප්පු කර ගැනීමේ හැකියාවක් නැහැ.පරීක්ෂණයක් පවත්වන්න කටයුතු කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

පෙර අය ගැන නෙවෙයි කතා කරන්න. දැන් අලුත් කණ්ඩායමක් ගියා නේ. ඒ අය ගිය නිසානෙ පෙර වැරදි අහුවුනේ. ඔබතුමා එම වැරදි හොයන්න කමිටුවක් පත් කළා. විත්තියයි පැමිණිල්ලක් තියෙනවා නම් අන්තිමේදී කරුණු ඔප්පු කර ගැනීමට නොහැකි වුණු බැවින්, විත්තිකරු නිදොස් කොට නිදහස්. ඒ ලියුම ඔයාගේ ෆයිල් එකට යනවා. ඒක වැරදි නම් මම කියනවා තවදුරටත් මේ නිවැරදි වෙච්ච දේ දුර යවන්න එපා. අපිට කවුරුවත් හුරතල් කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. කාට හරි විරුද්ධව කමිටුවක් තියෙනවානම්, කමිටු වාර්තාව සභාවට එන්න ඕන.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

අල්ලස් හා දූෂණ එකෙනුත් ලියුමක් ඇවිල්ලා. මේ මස 14 මෙම නිලධාරියා එම ආයතනයට යනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ඒකෙන් විතරක් නෙවෙයි අපායෙනුත් එනවා. මොකද දුප්පත් මිනිස්සුන්ගේ සල්ලි. මෙහෙ බෝක්කුව දාගන්න විදිහක් නැතුව, වැලි ටික ගේන්න විදිහක් නැතුව දගලනවා. මාසෙ ආදායම එක්කෙනෙක් දෙන්නෙක් කාල විනාශ කරනවා. තමුන්නාන්සේ අනෙක් පැත්තෙන් බැනුම් අහනවා. ඒක නිසා ඕක අපායෙන් එන දඬුවමක්. ස්වභාවධර්මය දඬුවම් දේවි. මේක සාංඝික වස්තුවක්. කවුරු කැවත් ස්වභාධර්මය දඬුවම් දෙනවා.

ඊළඟට මම අපේ ප්‍රදේශයේ ගල්කන්දෙ උඩට යන මාර්ගය ටොන් 20- 40 වාහන දාලා, දැන් දෙතුන් සැරයක් බෝක්කුව කැඩිලා තියෙනවා. වාර්තාගත කරලා කියන්න. මරණ පරීක්ෂණයකට කටඋත්තර දෙන්න වුනොත්, මට ඇවිල්ලා මෙන්න මේ සභාවේ අහවල් දවසෙ කිව්වා කියන්න පුළුවන්. තමුන්නාන්සේලා ගිහිල්ලා හදමු යන එක නෙවෙයි. එතන තියෙන හාඩ්වෙයාර් එකේ ටොන් 20- 25 ගහපු ලොරි උඩට ගන්න වෙලාවේ දැන් තුන් සැරයක් කැඩුනා. එක සැරයක් ප්‍රාදේශීය අයිති කට්ටිය දැම්මා. එක සැරයක් මාර්ගය සංවර්ධනය කරන කට්ටිය දැම්මා. දැන්නැවතත් කැඩිල තියෙනවා බෝක්කුව. එයාලට කියලා දාවනවා මිසක් අපි දාන එක අවශ්‍ය නැහැ. රාත්‍රියට කවුරුහරි ඇවිල්ලා වැටුනොත් මරණාසන්න තුවාල ඇති වේවි ඇවිල්ලා මට ටොන් 20 ට වඩා වැඩිය පටවගෙන යනවා. මාරාන්තික වලක් හැරිලා තියෙනවා. අකුරක් නැර මේවා වාර්තාගත කරලා තියන්න. එදාට සාක්ෂි දෙන්න එතැනට එම වළට දෙන්නෙක් වැටිල තියෙනවා. නමුත් මාරාන්තික වුනේ නැහැ. මොකද ඒ හාඩ්වෙයාර් එකේ මනුස්සයා මගෙත් එක්ක ලක්ෂ 8ක් ඉල්ලලා නඩු කියනවා. මම පාරෙ කාපට් දැමුවේ රාජ්‍ය මුදල් වලින්. කාණු කැපුවා කියලා මගෙත් එක්ක බද්දේගම උසාවි යනවා. ඒ නිසා එවැනි වන්දි ඉල්ලන මිනිස්සු ඉන්නෙ. අර බෝක්කු පවා කඩලා දානවා. දැනගන්න කියන්නේ.

ඊලඟට මම මෙතුමාට කිව්වා. ප්‍රේමලාල් ජයසේකර මමත් විරුද්ධයි එක්සත් ජාතික පක්ෂයේ වුනත්. රනිල් වික්‍රමසිංහ ජනාධිපති වුනාට මම හැමදේටම අත උස්සන්නේ නැහැ. ප්‍රේමලාල් ජයසේකර කියන්නෙ රත්නපුරේ දරු පවුලක පියා විනාශ කළ කෙනෙක් තමුන්නාන්සේලා බලන්න, සොහොන් කොතේ ෆොටෝ එක වත් තිබ්බෙ නැහැ. එහෙව් පුද්ගලයෙකුට ඇමතිකමක් දීලා කියන්නේ, දරු පවුලක් විනාශ වෙලා, ඒ දරුවොත් භාර්යාවත් ශාප කරනවා. මම කියන්නේ එවැනි පුද්ගලයන් පැත්තකින් තියන්න ඕන. ඒ වගේ දේවල් වලට තමුන්නාන්සේ නෙවෙයි අපිත් විරුද්ධයි. අපි අත උස්සන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට එකතු වුණා කියලා සමහර වෙලාවට මේක මෙහෙයවන හස්ත තියෙනවා. ඒව තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒවා නිවැරදි විය යුතුයි කියන එක මමත් තමුන්නාන්සේලාට එකඟයි. අම්මයි පුතයි මෙයා තමයි මැරුවෙ කියනකොට දේශපාලන වශයෙන් අපිට ලොකු හානියක් සිද්ධ වෙනවා. කාගේ හරි කෙනෙකුගේ පවුලෙ කෙනෙක් විනාශ කරලා, ඒවට දඬුවම් දෙන්න ඕන කෙනෙක්ම එම පුද්ගලයව රකිනවනම් එලක් නැහැ. කවුරු කළත් ඉස්සරහට හරි මේවා නිවැරදි විය යුතුයි. 2015 ජනාධිපතිවරණයේදි රන්ජන් රාමනායක මහත්තයා උසාවියට අපහාස කලා කිව්වට පස්සේ, මේ තියෙන නඩු සියල්ලම නිදොස් කොට නිදහස්. ඇත්තටම කණගාටු වෙනවා. මේ රට ගැන, අපි මේ සියල්ලටම ඔවුන් එක්ක හිට ගන්නවා කියලා ඔබතුමාල හිතුවට හරි දේට විතරයි අපි හිට ගන්නේ. හිතල බලන්න තමන්ගේ ගෙදර ස්වාමියා මැරුවා. දරු පවුලක් අසරණ වුනා. එම පුද්ගලයන් නිර්භයව අපි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. ඔමල්පේ සෝභිත හිමි විරුද්ධ වුණා. ගල් අඟුරු ගෙන්වන්න. ඩුබායි වලින් දෙන්න සූදානම් කෙරුවා. හය මාසයකින් සල්ලි දෙන්න කියලා කැමැත්ත ප්‍රකාශ කෙරුවා. මේකට ජේ.වී.පී එකේ නිලධාරීන් පිරිසක් විරුද්ධ වුණා. ඩුබායිවල එම කම්පැනියෙ

විත්තිකරුවෙක් කළා. අපි බඩු දෙන්නේ නැහැ. අපි බඩු නොදුන්නට කමක් නෑ කියලා. මොකද ඕමල්පේ සෝභිත හිමි ඇතුළු මේකට පැමිණිල්ල දමපු සියලු දෙනා දවස් 7 - 12ක් විදුලිය කප්පාදු කළොත් වගකියන්න ඕන. ඒක නතර කලාට අන්න නීත්‍යානුකූලවම දඬුවම් කරන්න ඕන. අන්න එදාට අපි එතනත අන්න ඒක නිසා වැරැද්ද වහලා ගහන්න එපා. තමුන්නාන්සේලා දැන් කියනවා කන්න නෑ කියලා. පහුගිය කාලේ වැට් එක අඩු කරනකොට කිව්වා. වැරදියි වැට් එක අඩු කලා කියලා. වැට් එක වැඩි කරන කොට කියනවා වැරදියි. පොඩි අය බඩගින්නෙ කියලා. මොකක්ද මේ. තමුන්නාන්සේලා බදු ගැහුවත් බනිනවා. බදු නොගැහුවත් බනිනවා. වෙළෙඳපොළේ බඩු ඉහළ යන විට කෑගහනවා. නමුත් තේ මිල වැඩිවෙලා තියෙනවා. දේශීය සහල් ටික 200.00ට කැවට පව් නැහැ. තමුන්නාන්සේ ගොවියන්ගෙ පැත්තෙ දකුණට ඇවිල්ල කෑගහනව සහල් රුපියල් 100.00 ට ගන්න විදියක් නැහැ. මිළෙයි කියලා. අරහෙ ගිහිල්ලා කෑගහනවා. ගොවියාගේ වී ටික විකුණගන්න විදිහක් නෑ කියලා. මොකක්ද ඔය දේශපාලනය. දෙපිටකාට්ටුයි. වී ටික විකුණගන්න බෑ කියලා පොළොන්නරුවට ගිහිල්ලා මාධ්‍ය සාකච්ඡා තියනවා. ගමේ දේශපාලනඥයා සභාවට ඇවිල්ල කෑ ගහනවා. සහල් කිලෝ එක රු. 200.00 යි කියලා. ඉතින් ඒක නිසා මන්ත්‍රීතුමා, ගරු සභාපතිතුමා අපි පක්ෂයකටවත් කඩේ යන්නේ නැහැ. හොඳ කොන්දක් ඇතිව අපි බොහොම වැදගත් විදිහට දේශපාලනය කරන්නේ. ජනතා විමුක්ති පෙරමුණ වාසියටනේ ඔය කියන්නේ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

දැන් තෙල් පෝලිම් නැහැ. ස.තො.සෙ පෝලිම් නැහැ. බදාදා තල්ගස්වල පෝලිමේ සීනි කිලෝ එක රු: 229.00යි. දැන් පෝලිමේ හිටියට මොකද, බඩු ලාබයි. න්‍යායපත්‍රය තමුන්නාන්සේලාට හොයාගන්න බැහැ. එහෙම වුනා නම් අද ආණ්ඩුව අල්ලලා, ඒ නායකයාටත් පේන්නෙ නැහැ. අන්ධයි මම හිතන්නේ. මේ පිළිබඳව මම වැඩිය කතා කරන්න යන්නේ නැහැ. මම කිව්වේ තමුන්නාන්සේ වත් හරියට කරයි කියලා.

අවුරුදු දෙකකට ඉස්සෙල්ලා මිනිස්සු පාරට බහිනවා. වැට් බද්ද ඉවත් කළාම ජීවත් වෙන්න විදිහක් නැහැ. ආර්ථිකය කඩා වැටිලා කියලා. ඔව් ආර්ථිකය කඩා වැටුනා. ඊට පස්සේ බද්ද ගැහුවම, බද්ද ගැහුවා කිව්වා. යූරියා ගෙන්නුව එකත් බාලයි. ඒක බෙදුවම කිව්වා. හොඳ නැහැ. ගන්න එපා කියලා. රු. 45000.00 ට තිබුනු යූරියා හොන්ඩරය දැන් රු. 10000.00 ට දෙනවා. ඉතින් ඒක නිසා තමුන්නාන්සේලා කුහක වෙන්න එපා. කුහක දේශපාලනය අතහරින්න. තමුන්නාන්සේලටත් එක්කමයි කියන්නෙ.මම මීට වඩා දීර්ඝව කතා කරන්නේ නැහැ. කෙනෙක් මලගෙදරකට, මඟුල් ගෙදරකට ගියොත් බඩු මිල සම්බන්ධව කතා කරන්න එපා. ඒ පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැත්නම් අපට කරන්න දෙයක් නැහැ.

ඊළගට ජනතා විමුක්ති පෙරමුණ කිව්වට ජාත්‍යන්තර සහයෝගය නැතිව කිසි දෙයක් කරමු බැහැ කියලා, ඒ ජාත්‍යන්තර සහයෝගය ගන්න පුළුවන් එකම හැකියාව ඇති පුද්ගලයා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා. මේ රට ටිකක් කරනකම් බලාගෙන ඉන්න. එච්චරයි මට කියන්න තියෙන්නේ. එහෙම නම් මේ වගේ කතා කරන සභාවක් අපට ගොඩනගලා දුන්නෙ වර්තමාන ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායම. ඉතින් ඒ නිසා ඒ ශක්තිය තුළ තමයි මෙතන සභාවක් පවත්වන්නෙ. සාමාන්‍ය මිනිසා ඉතා අමාරුවෙන්නිවසක් හදනවිට, කූට ව්‍යාපාරිකයෝ සතියෙන් දෙකෙන් ගෙවල් හදනවා. ලක්රුවන් මන්ත්‍රීවරයාට යම් අසාධාරණයක් වුණා නම්, අර එවපු තක්සේරු මුදල හරි ගෙවන්න. මොන රජය ආවත් එතුමන්ලාට සර්ව සාධාරණයක් ඉටු වෙන්න ඕන. මෙතුමා යෝජනාවක් නම් ගෙන ආවෙ මම ඒක ස්ථිර කරනවා. එලිසබෙත් මහ රැජිනගේ අභාවප්‍රාප්ත වීම පිළිබඳ ශෝකය පළකර සිටිනවා. විදේශිකයෝ ඇවිල්ලා හදපු දේවල් නිසා තමයි මෙහෙමවත් රට තියෙන්නෙ. මං පුංචි කතාවකින් අවසන් කරන්නම්. ජේ .ආර්.ජයවර්ධන මැතිතුමා ජනාධිපති වෙලා ඉන්නකොට, වික්ටෝරියා වේල්ල මහවැලි ජලාශය හදනකොට ඒක හදන්න අපි ගාව සල්ලි නැහැ. අවුරුදු

තිහකට ඇස්තමේන්තු කරලා තිබුණේ. මේ ගැන කල්පනා කර කර ඉන්නකොට, ගාමිණී දිසානායක මහත්තයා කියනවා අපි යමු එංගලන්තෙ මහරජින මුණගැහෙන්න කියලා. ජේ .ආර් ජයවර්ධන මහතා හා ගාමිණී දිසානායක මැතිතුමා යනවා මහරජින හම්බවෙන්න. ජේ .ආර් මහත්තයාගෙන් අහනවා. ඔබතුමාට මොකද්ද ඕන ණය කියලා. මිනිස්සු අමාරුවෙන් ඉන්නෙ. මහවැලි ජලාශය ඉදි කරන්න ඕන කියලා. එවිට රජින අහනවා මොකද්ද ලැබෙන ප්‍රතිලාභය කියලා. එවිට උත්තර දෙනවා. කෘෂිකර්මය, විදුලිය ආදී වැඩ කොටස් තියෙනවා. එයට සතුටු වුණු රජින, හොඳයි මම සල්ලි දෙන්නම්. ඔබතුමාලා ඒ කටයුතු කරන්න කියලා කියනවා. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා කියනවා. මේ වේල්ල හදලා දෙන උදව්වට, ඔබතුමියගේ ආත්තම්මගේ නම දාන්නම් කියලා. ඒ අනුව තමයි වික්ටෝරියා කියන නම දැම්මේ. එවිට රජින කියනවා බොහොම සතුටු වෙලා. මම එනවා විවෘත කරන උත්සවයට කියලා. එතුමිය නියෝග දෙනවා නිලධාරියෙකුට. ලංකාවට ගිහිල්ලා මේක බලලා තියෙන මුදල් පරිත්‍යාග ලෙස දෙන්න කියලා. අන්තිමට එතුමිය ඇවිල්ලා විවෘත කරලා යනවා. අන්න ඒ සංවර්ධනය මත තමයි පොහොර ටික තිබුණත් නැතත් වී ටික භුක්ති විඳින්නේ. ඒ නිසා අපේ බලවත් ශෝකය එතුමිය මෙනුවෙන් මුළු සභාව වෙනුවෙන් පුදකරමින්. මගේ කතාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. උප සභාපතිතුමනි, අජිත් මන්ත්‍රීතුමාත්, චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කළ කාරණාවලදී යෝජනා වුන අභාවප්‍රාප්ත එංගලන්ත රජින වෙනුවෙන් ශෝක යෝජනාව මමද අනුමත කරමින්, පොදු රාජ්‍ය මණ්ඩලීය නායිකාව ලෙස තමන්ගේ කාලයේ රටේ අග්‍රාමාත්‍යවරු 15දෙනකුට නායකත්වය දෙමින්, වසර 70ක් වැනි දීර්ඝ කාලයක් නිහතමානී නායිකාවක් ලෙස තමන්ගේ භූමිකාව ඉටු කළ නායිකාවක් ලෙස මෙතුමිය ඉතිහාසගත වෙනවා. ඒ වගේම අපේ රටටත් උදව් උපකාර කරමින්, වික්ටෝරියා වැනි වටිනා වාරි ව්‍යාපෘති ඉදි කිරීමට සහයෝගය දීම පිළිබඳවත් සිහි කරමින්, අපගේ ආගම අනුව ඇයට නිර්වාණ සුවය ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම නව රජු ලෙස පත්වූ චාල්ස් කුමරුවන්ටත් සුබ පැතීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ සමගම මෙයත් මම සිහිපත් කරනවා. පසුගියදා රටේ ඇති වූ බිහිසුණු ක්‍රියාවලිය තුළ, තමන්ගෙ තනතුරේ බලය පාවිච්චි නොකර, අරගලකරුවන්ට තමන්ගේ ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමට ඉඩදී, මච්චිමෙන් පිටව ගිය හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නැවත තම මච්චිමට පැමිණීම පිළිබඳව අගය කරනවා. මම නම් පෞද්ගලික සිතන්නේ එතුමා තමයි system change කිරීමට ආපු නායකයා කියලා. නමුත් කොතනක හෝ මෙතුමට වැරදුනා. එයින් අවස්ථාවාදීන් උපරිම ප්‍රයෝජන ගත්තා. මෙයට ලෝකයම වෙලාගත් කොරෝනා වසංගතය ප්‍රධාන වශයෙන් බලපෑවා කියලයි මට සිතෙන්නේ.

ගරු මන්ත්‍රීවරුනි ජයවීර මන්ත්‍රීතුමා අදහස් ඉදිරිපත් කරමින් කළ ප්‍රකාශ පිළිබඳව මම ප්‍රකාශයක් කළ යුතුයි. මන්ද කිසිදු අභ්‍යන්තර සිදුවීමක් නොදැන කරන ප්‍රකාශ නිසා. සභාපතිවරයා හැටියට මාව අපහසුතාවයට පත්වන නිසා.

ඔබතුමාලම තමයි මෙම සභාවේ දී නිතර ප්‍රකාශ කරන්නේ, සභා සේවකයින්ගේ වැඩ දුර්වලයි කියලා. මතක තියාගන්න. ජයවීර මන්ත්‍රිතුමා, ඊයෙ දින මෙම සභාව අසල සිදුවීමක් වුණා. සභාවේ මම ඉන්නකොට කෝල් එකක් එනවා. සභාපතිතුමා සභාවේ තණකොළ කපන මැෂිම සමග සේවකයින් වැඩට එව්වද කියලා. එවිට මම ඇහුවා කොයි ප්‍රදේශයටද කියලා. ඔවුන් කිව්වා කුරුපනාව අලවත්ත විල පාරට කියලා. ඔහු නැවත කිව්වා. වැඩ කොහොම වෙතත්, ඒ මිනිස්සු වාඩිවෙලා කයිය ගගහා ඉන්නවා කිව්වා. මම එවිට සභා ලේකම්තුමිය ගෙන්වා වහාම මේ කියන ස්ථානයට ගොස් සොයා බලන්න කියලා. ඒ සමගම මම දැක්කා. මෙම සඳහන් කරන සේවකයින් දෙදෙනා සභාව අසල ඉන්නවා. මම ඔවුන්ගෙන් ප්‍රශ්න කළේ නැහැ. වෙලාව හවස තුනට විතර

ඇති. ඊට ටිකකට පසුව ප්‍රථම කෝල් කළ අයගෙන්ම, නැවත කෝල් එකක් එනවා. මට කියනවා මේ බව දැන්වූවා කියලා, ඔහුට මෙම සේවකයන් තර්ජනය කරනවා කියලා. එවිට මම ඔහුගෙන් ඇහුවා එතනට සභා නිලධාරීන් ආවද කියලා. ඇවිත් නම් ඒ බව ඔවුන්ට දන්වන්න කියලා. නමුත් මටම පුදුමයි අදාල සේවකයින් දැන් සභාව අසල සිටියා. මේ වෙනකොට කොහොමද එතනට ගියේ කියලා. පසුව මම ගිය නිලධාරීන් නැවත පැමිණි පසු විස්තර විමසන විට දැනගත්තා. ඔවුන් සමගම අදාළ සේවකයින් එම ස්ථානය ගොස් ඇති බව. පසුව තමයි මම ප්‍රශ්න කරනකොට දැනගන්නේ, එක් සේවකයෙකුගේ කකුලට ගලක් වැදිලා, ආබාධයට ලක් වී ඇති බව. නමුත් ඔවුන් මට මේ බව කීවේ නැහැ. මම ඒ අවස්ථාවේ මොවුන්ට වේගවත්ව කතා කළා. පසුව මම නිලධාරීන්ට පැවසුවා. තුවාල වෙලා තියෙනවා නම්, වාහනෙන් රෝහලට එක්ක ගොස් ප්‍රථමාධාර ලබා ගන්න කියලා. නමුත් මෙම කම්කරුවා එය ප්‍රතික්ෂේප කරලා, තනියෙන් රෝහලට ගොස් ප්‍රථමාධාර ලබාගෙන තියෙනවා. පසුව මම දැක්කා. ඔහු වැඩ නිමකර, අත්සන් කරන පොතේ අත්සන් කිරීමට ඇවිත් ඉන්නවා. මම ඔහුගෙන් බෙහෙත් ගත්තද කියලා කිහිප සැරයක් ඇහුවා. නමුත් ඒ කිසි විටෙකත් ඔහුගෙන් පිළිතුරක් නොලද තැන, මම ඔහුට ප්‍රකාශ කළා. මම මෙතන සභාපති බව. මගේ තියෙන මනුස්සකමෙන් අයුතු ප්‍රයෝජන නොගන්නා ලෙස. මීට ප්‍රථම මෙහි සිටිය සභාපතිතුමන්ලා සේවකයින්ට දුන් දඬුවම් පිළිබඳවත් මම මතක් කළා. මගෙන් එවැනි සිදුවීම් නොවන නිසාද මේ ආඩම්බරකම කියලා. මෙයත් මතක් කරන්න ඕන. මෙහි සමහර සේවකයන් දේශපාලන කෝණ වලින් තමයි තමන්ගේ සිතුවිලි ප්‍රකාශ කරන්නේ. මේ උදවියත් එහෙම අය. නමුත් සියලු දෙනා දන්නවා. මම මේ වනතුරු දේශපාලන කෝණවලින් බලලා, වැඩ නොකරපු බව. මම එහෙම බැලුවනම් සේවකයින් කිහිප දෙනෙක්ම ගෙදර. මට දුක මගේ මනුස්සකම අවභාවිතා වීම පිළිබඳව. දැන් ජයවීර මන්ත්‍රීතුමාට තේරෙනවා ඇති සිදු වූ සිදුවීම සම්බන්ධව. තවද මම ඔබතුමාට කියන්න කැමතියි. ඔබතුමා නිතරම මෙම සභාවෙ ප්‍රකාශ කරන්නෙ එකම දේ. බඩු මිළ, අරව නෑ, මේවා නෑ කියලා. නමුත් කියන්නෙ නෑ මෙයින් මිදෙන හැටි. ඔබතුමා ඔය කියන කරුණු ගිරවා වගේ ප්‍රකාශ කලාට, කරන හැටි පෙන්වා දෙන්නෙ නැතුව ගමේ, කඩපිලේ කතා කරනවා වගේ මෙතනදී කතා කරන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රීවරුනි, තරංග මන්ත්‍රීතුමා ප්‍රශ්න කලා. KDAW සමාගමෙන් කරන පාර පිළිබඳව. මේ පිළිබඳව මට KDAW සමාගමෙන් විමසුවිට ප්‍රකාශ කළේ, තෙල් නොමැති ප්‍රශ්නය තමයි තියෙන්නේ. තෙල් දෙන්නෙ නැහැ. ව්‍යාපෘති නවත්තන්න කියලා තමයි කියලා තියෙන්නෙ. ඒ නිසා QR ක්‍රමයට හම්බවෙන තෙල් ටිකෙන් තමයි එතුමලා වැඩ කරනවා කියලා කියන්නේ. අපි ඉල්ලීමක් කරමු. අපේ පාරවල් ටික හදාගන්න. මෙන්න මේ ආයතන වලට තෙල් ලබා දෙන්න කියලා.

ඒවගේම වීදි ලාම්පු ඊයේ පෙරේදා 50 - 60 මාරු කළා. ඒක ටිකක් අමාරුයි කරගෙන යන්න. ලයින් එකක යනකොට මේ බල්බ් 2-3 වගේ ඒවට ගිහිල්ලා කරන්නත් බැහැ. ක්ෂණිකව කරගන්න. දිනවකවානු දුන්නට දැන් එහෙම කරන්න බැහැ. අපට හැකි ආකාරයෙන් කරගෙන යනවා. පොලේ මුදල් එකතු කිරීම සම්බන්ධවත් සාකච්ඡා වුණා. ඒ පිළිබඳවත් දැන් ප්‍රගතියක් තියෙනවා. මම උනන්විටිය පොල නැවත ආරම්භ කරන්නට සූද්ද කෙරෙව්වා. උඩුගම පොළට ගියා එවිට මුදලාලිලත් කැමැත්ත ප්‍රකාශ කළා. උනන්විටිය පොල ආරම්භ කිරීම සම්බන්ධව එම්.එම්. දිසානායක මන්ත්‍රීතුමත් දැනුවත් කළා. පොලේ දැන් ප්‍රගතියක් තියෙනවා. අපි කතා වුන පරිදි, ලක්රුවන් මන්ත්‍රීතුමා, කමිටුවක් පත් කරලා, කරල බලමු ඉදිරියේදී ගන්න පුළුවන් ආදායම් පිළිබඳව.

ඒ වගේම ගවයන් පිළිබඳව, පසුගිය දවසක ප්‍රචාරය යවලා, අදාල නිලධාරීන් ගිහිල්ලා, පශු වෛද්‍ය නිලධාරීන් ඇවිල්ලා, ගවයින්ගේ කන් විදීම සිදු කළා. හය දෙනයි ඇවිල්ල තියෙන්නෙ. 15 වැනිදායින් පස්සේ අපි ගවයින් අල්ලන්න කටයුතු කරලා, නීත්‍යානුකූලව වෙන්දේසි කිරීමට කටයුතු කරනවා. මීට වඩා යමක් ප්‍රකාශ කරන්නට යන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරුනි.

මන්ත්‍රීතුමියනි. අපට ඇත්තටම දෙයක් වුනාට පස්සේ තමයි එහි වටිනාකම තේරෙන්නේ. අපේ මිනිස්සු නොසැලකිල්ලෙන් අමාරුවේ වැටෙන්නේ. විශාල ගණන් දීලා පහුගිය දිනවලදී ෆුට් සයිකල් ගත්තා. දැන් එකක්වත් නැහැ. කුඩු ලිප් ගත්තා. දැන් ඒවා නැහැ.  බලන්න මිනිස්සුන්ගෙ නොසැලකිල්ල ආණ්ඩුවට පටවනවා. කවුද හැදුනේ? මුදලාලිලා. අන්න ඒ නිසා අපි හැදෙන්න ඕන. හැබැයි  ගිනි තැබීමෙන් නෙවෙයි, ඒවා ආරක්ෂා කිරීමෙන්. රට හදන්න පුළුවන් අපි හැමදෙනාම එකමුතුභාවයෙන් විතරයි.  සියලු දෙනා එකතු වෙලා, අවුරුදු 5 තුල මේ රට නිවැරදිව කරගෙන ගියොත්, ලෝකේ උතුම්ම රට කරන්න පුළුවන්. කොහොමහරි අපි එකතු වුණොත් රට ගොඩදාන්න පුළුවන් වේවි. කොහොමහරි මැතිවරණය ආවත් නාවත්, අපි එකතුවෙලා වැඩ කරමු යනුවෙන් සියලු සභිකයින්ගෙන් ඉල්ලන අතර, සියළුම සභිකයින් නියමිත වෙලාවට සභාවට පැමිණෙන්න හා නියමිත වෙලාවට සභාව අවසන් කිරීමට කටයුතු කරන්නත් කියලා ඉල්ලමින්, විශේෂයෙන්ම නන්දන මන්ත්‍රීතුමාට හා පතිනායක මන්ත්‍රීතුමාටත් නිවාඩු අනුමත කරමින්, අද සභාවට සැපැමිණි සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට ආශිර්වාද කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:-